# සැදැහැ සිතින් දඹදිව වැඳ පුදා ගනිමු



# සැදැහැ සිතින් දඹදිව වැඳ පුදා ගනිමු

ප්‍රධාන අනුශාසක

**කොළඹ වැල්ලවත්ත විහාරමාවතෙහි බෝධිරුක්ඛාරාමාධිපති, සාමචිනිසුරු ශාසන කීර්ති විචිත්‍රභාණක ධර්ම කීර්ති ශ්‍රී සද්ධර්මාචාර්ය වස්කඩුවේ ධම්මිස්සර නායක හිමිපාණෝ.**

චාරිකා සංවිධායක

**පාලිත මාතරගේ**


ලක්දිව චාරිකා

**නො. 36 බී, විහාර මාවත, වැල්ලවත්ත, කොළඹ - 06.**

දුරකථන අංකය

**011-2361424 · 0777-162617**



**රජයේ ලි. ප. අ. - W/A 46666**

**බුද්ධ ශාසන අමාත්‍යාංශයේ ලියාපදිංචි ආයතනයකි.**

# අප ආයතනය සමඟ ඔබට සම්බන්ධ විය හැකි චාරිකාවන්

## දින 12 දඹදිව චාරිකාව

**සෑම වර්ෂයකම:**
මාර්තු / නොවැම්බර් / දෙසැම්බර් මාසවලදී චාරිකා පිටත්වේ.

**චාරිකාවට අයත් සිද්ධස්ථාන:**
බරණැස / බුද්ධගයාව / රජගහනුවර / විශාලාමහනුවර / කුසිනාරානුවර / ලුම්බිණිය / කපිලවස්තුපුරය / සැවැත්නුවර / සංකස්ස / දිල්ලියේ සතිපට්ඨාන සූත්‍රය දේශනා කළ ස්ථානය

**විශේෂ පිංකම්:**
බුද්ධගයාවේ ශීලව්‍යාපාරය, කිරිපිඬු පූජාව සහ සාංඝික දානය.
දිල්ලි ජාතික කෞතුකාගාරයේ ඇති කපිලවස්තු ධාතූන් වහන්සේ වන්දනා කිරීම

- වායුසමනය කරන ලද බස් රථ
- ශ්‍රී ලාංකික ක්‍රමයට ආහාරපාන
- ලොව පුදුම හතෙන් එකක් වන ටජ්මහල් මන්දිරය කැමති අයට මුදල් ගෙවා නැරඹිය හැක.
- දිල්ලි නගර සංචාරය සහ සාප්පු සවාරිය
- බීමට බෝතල් වතුර
- කොළඹ - දිල්ලි ගුවන් මගින්
- දුම්රිය ගමන් නැත.

අය කිරීම රු. ..................................

- අවු. 70 ට අඩු සෑම වන්දනා කරුවකුටම රු. 400,000.00 හදිසි අනතුරු රක්ෂණාවරණය
- ගමන්මලු 02ක්
- ඉන්දියානු සහ නේපාල වීසා
- ගුවන් ටිකට්පත්
- බෞද්ධ සිද්ධස්ථානවලට ඇතුල්වීමේ ගාස්තු මෙම මුදලට අයත්ය.

**අතරමගදී කිසිදු මුදලක් අයනොකෙරේ.**

# දින 15 දඹදිව චාරිකාව

**සෑම වර්ෂයකම:**
පෙබරවාරි / මාර්තු / අගෝස්තු / නොවැම්බර් මාසවලදී චාරිකා පිටත්වේ.

**චාරිකාවට අයත් සිද්ධස්ථාන:**
සාංචි / කොසඹෑනුවර / බරණැස / බුද්ධගයාව / රජගහනුවර / විශාලාමහනුවර / කුසිනාරානුවර / ලුම්බිණිය / කපිලවස්තුපුරය / සැවැත්නුවර / සංකස්ස / දිල්ලියේ සතිපට්ඨාන සූත්‍රය දේශනා කළ ස්ථානය

**විශේෂ පිංකම්:**
බුද්ධගයාවේ ශීලව්‍යාපාරය, කිරිපිඬු පූජාව සහ සාංඝික දානය.
දිල්ලි ජාතික කෞතුකාගාරයේ ඇති කපිලවස්තු ධාතූන් වහන්සේ වන්දනා කිරීම

- වායුසමනය කරන ලද බස් රථ
- ශ්‍රී ලාංකික ක්‍රමයට ආහාරපාන
- ලොව පුදුම හතෙන් එකක් වන ටජ්මහල් මන්දිරය කැමති අයට මුදල් ගෙවා නැරඹිය හැක.
- දිල්ලි නගර සංචාරය සහ සාප්පු සවාරිය
- කොළඹ - දිල්ලි - කොළඹ ගුවන් මගින්

අය කිරීම රු. ..................................

- අවු. 70 ට අඩු සෑම වන්දනා කරුවකුටම රු. 400,000.00 හදිසි අනතුරු රක්ෂණාවරණය
- ගමන්මලු 02ක්
- ඉන්දියානු සහ නේපාල වීසා
- ගුවන් ටිකට්පත්
- බෞද්ධ සිද්ධස්ථානවලට ඇතුල්වීමේ ගාස්තු මෙම මුදලට අයත්ය.

**අතරමගදී කිසිදු මුදලක් අයනොකෙරේ.**

# දින 08 දඹදිව චාරිකාව

**සෑම වර්ෂයකම:**
පෙබරවාරි / ජූලි / දෙසැම්බර් මාසවල දී චාරිකා පිටත් වේ.

**චාරිකාවට අයත් සිද්ධස්ථාන:**
බරණැස / බුද්ධගයාව / කුසිනාරානුවර / ලුම්බිණිය / සැවැත්නුවර / රජගහනුවර / නාලන්දා / විශාලාමහනුවර

- බුද්ධගයාවේ ශීල ව්‍යාපාරය.
- වායුසමනය කරන ලද බස් රථ.
- වායුසමනය කරන ලද හෝටල් කාමර (දෙදෙනෙකුට එක් කාමරයක් බැගින්).
- කොළඹ - වරණාසි ගුවන් මගින්.
- බුෆේ ක්‍රමයට ආහාර හෝටල් වලින්.

අය කිරීම රු. ..................................

- ගුවන් ටිකට්පත්.
- ඉන්දියානු සහ නේපාල වීසා.
- හදිසි අනතුරු රක්ෂණය.
- බෞද්ධ සිද්ධස්ථාන වලට ඇතුළුවීමේ ගාස්තු ද මෙම මුදලට අයත් ය.
- අතරමග දී කිසිදු මුදලක් අය නොකෙරේ.

# සුඛෝපභෝගී බැංකොක් චාරිකාව

**රාත්‍රී 04 යි දින 05 යි.**

**සෑම වර්ෂයකම:**
අප්‍රේල් / මැයි - දෙසැම්බර් / ජනවාරි

**චාරිකාවට අයත් ස්ථාන:**

- විහාරස්ථාන හා නගර සංචාරය.
- සෆාරි වර්ල්ඩ්.
- ඩිනර් ක්‍රෑස් (නැවක රාත්‍රී භෝජන සංග්‍රහය).
- ඩ්‍රීම් වර්ල්ඩ්.
- ස්නෝ වර්ල්ඩ්.
- සාප්පු සවාරිය.

අය කිරීම රු. ...................................

- ගුවන් ටිකට්පත්.
- වීසා ගාස්තු.
- හදිසි අනතුරු රක්ෂණය.
- තරු 03 හෝටල්.
- උදය / දහවල් / රාත්‍රී ආහාර.
- වායුසමනය කරන ලද වාහන.
- ඇතුල් වීමේ ගාස්තු ඉහත මුදලට අයත් ය.
- අතරමග දී කිසිදු මුදලක් අය නොකෙරේ.

# දඹදිව චාරිකා වලදී ඒ ඒ ස්ථානවලට ඇති දුර ප්‍රමාණයන්

| සිට | දක්වා | දුර |
|---|---|---|
| මදුරාසි | බෝපාල් | කි. මී. 1496 |
| බෝපාල් | සාංචි | කි. මී. 55 |
| බෝපාල් | වාරණාසි | කි. මී. 816 |
| වාරණාසි | සාරානාත් | කි. මී. 12 |
| සාරානාත් | බුද්ධගයාව | කි. මී. 265 |
| බුද්ධගයාව | රාජ්ගිරි | කි. මී. 80 |
| රාජ්ගිරි | නාලන්ද | කි. මී. 13 |
| රාජ්ගිරි | වෛශාලි | කි. මී. 102 |
| වෛශාලි | කුසිනාරා | කි. මී. 240 |
| කුසිනාරා | ලුම්බිණි | කි. මී. 176 |
| ලුම්බිණි | කපිලවස්තු | කි. මී. 88 |
| කපිලවස්තු | ශ්‍රාවස්ති | කි. මී. 146 |
| ශ්‍රාවස්ති | සංකස්ස | කි. මී. 400 |
| සංකස්ස | ආග්‍රා | කි. මී. 185 |
| ආග්‍රා | නවදිල්ලිය | කි. මී. 200 |
| නවදිල්ලිය | මදුරාසිය | කි. මී. 2243 |

# දඹදිව බුද්ධ භූමි වන්දනා ගාථා

## බරණැස

සංකප්පයං දස සහස්සිය ලෝක ධාතුං
දේසේසි යත්ථ භගවා වර ධම්ම චක්කං
බාරාණසී පුර සමීප වරේ මිගාතං
තං ධම්ම චේතිය මහං සිරසා නමාමි.

## බුද්ධගයාව

යස්මිං නිසජ්ජ වජිරාසන බන්ධනේන
ජේත්වා සවාසන කිලේස බලං මුනින්දෝ
සම්බෝධි ඤාණ මව ගම්ම විභාසි සම්මා
තං බෝධි චේතිය මහං සිරසා නමාමි.

## කුසිනාරාව

කත්වාන ලෝක හිත මත්ත හිතංච නාථෝ
ආසීතිකෝව උපවත්තන කානනම්හි
යස්මිං නිසජ්ජ භගවා නිරුපාදිසේසං
නිබ්බාණ චේතිය මහං සිරසා නමාමි.

## ලුම්බිණිය

මායා සුතෝ සුගත සාකිය සීහ නාථෝ
ජාතක්ඛණේ සපදසා මහිවංක මිත්වා
යස්මිං උදීරයි ගිරං වරලුම්බිණීයං
තං ජාත චේතිය මහං සිරසා නමාමි.

## ආනන්ද බෝධිය

සුරෝපිතං සුදත්තේන
සම්බුද්ධේන අපි පූජිතං
ආනන්ද බෝධි නාමෝ'යං
දුමින්දං සිරසා නමාමි.

## දෙව්රම් වෙහෙර ගන්ධ කුටිය

සාවත්ථියං ජේතවනේ විහාරේ
බුද්ධෝ විහාසි සුචිරං ජනතා හිතාය
දේසේසි ධම්ම විනයං සනරාමරානං
තං බුද්ධ චේතිය මහං සිරසා නමාමි.

## සංකස්සපුර චෛත්‍යය

සබ්බඤ්ඤුනාථ පවරෝ වරදේව ලෝකා
සංකස්ස නාම නගරං අවරෝහයිත්වා
දේසේසි ධම්ම මතුලං මිදං පණීතං
තං බුද්ධ චේතිය මහං සිරසා නමාමි.

# ඉන්දියාව

ඉන්දියාව මනුෂ්‍ය ලෝකයේ ආදිම රට නොව මිනිස් උපත හටගත් මුල්ම රටයි කීවොත් නිවැරදිය. ඉන්දීය ඉතිහාසය එතරම් දීර්ඝය. එය සංසාරයේ මුල සෙවීම හා සමානය. එතරම් ඈත අතීතයක් ඇති භාරතයේ දැනට පවතින තත්වය පමණක් කෙටියෙන් විස්තර කරමි.

ප්‍රජාතන්ත්‍ර පාලන රටවලින් අසූ කෝටියකින් යුක්ත ජනගහණයක් ඇති විශාලම රට වන අතර චීනය, හිමාලය නේපාලය, පකිස්ථානය, බුරුමය යන රටවල දේශසීමා වලින් හා ඉන්දියන් සාගරයෙන් වටවී ඇති, රජය පිළිගත් භාෂා 15 ක් ප්‍රධාන වශයෙන් භාවිතා කරන විවිධ ජන කොටස් වලින් යුක්ත වන ඉන්දියාවේ ජනගහනය හින්දු 82.8% ද මුස්ලිම් 11.3% ද ක්‍රිස්තියානි 2.6% ද සික් 2.0% ද බෞද්ධ 0.8% ද, ජෛන 0.5% ද වේ.

පැරණි භාරතය සොළොස් මහා ජනපද ලෙස බෙද පාලනය කළ අතර අද ඉන්දියාව දේශපාලන වශයෙන් ප්‍රාන්ත 30 කට බෙද එක් එක් ප්‍රාන්තයෙහි වෙනම ආණ්ඩු පිහිටුවා ඇත. සමස්ත ඉන්දියාවේම පාලන නගරය නව දිල්ලිය වන අතර ප්‍රධාන පාලන භාරය ඇත්තේ මධ්‍යම ආණ්ඩුවටය.

අවුරුදු 130 ක බ්‍රිතාන්‍ය පාලනයෙන් පසු 1947 නිදහස ලබාගත් ඉන්දියාව නව යුගයක් කරා ඉදිරියට ම පියමන් කරන අතර බාහිර දියුණුව ද, ආධ්‍යාත්මික දියුණුව ද, වැඩිවෙමින් පවතී. නමුත් පුරාණ ගති සිරිත් නම් වෙනසි නැති බව කිව යුතුය. බෞද්ධාගම වැළඳ ගන්නා පිරිස ක්‍රමයෙන් වැඩිවන්නේ කුලහීනයන්ට වෙන සරණක් නැති බැවිනි. කෙසේ වෙතත් තම රටේම නිෂ්පාදනය වන සියළුම භාණ්ඩ සහ ආහාරපාන ආදිය පරිභෝග කරමින් ඉන්දීය ජනතාව තෘප්තියට පත්වීම ප්‍රශංසා කටයුත්තකි.

# චෙන්නායි (මදුරාසිය)

වර්තමානයේ මදුරාසි නගරය චෙන්නායි නමින් හැඳින්වේ. මදුරාසියට පැමිණෙන ශ්‍රී ලාංකික වන්දනාකරුවන්ට මහා බෝධි විශ්‍රාම ශාලාව හොඳම ක්ෂෙම භූමියයි. මදුරාසිය තමිල්නාඩු ප්‍රාන්තයේ අගනුවරයි. විශාල නගරයකි. දැනට මදුරාසිය ප්‍රසිද්ධ වෛද්‍ය මධ්‍යස්ථානයකි.

අනගාරික ධර්මපාල ශ්‍රීමතාණන් විසින් දුරදක්නා නුවණ ඇතිව ඉදිකළ මදුරාසි මහා බෝධි විශ්‍රාම ශාලාව පූජ්‍ය එල්ලාවල නන්දීස්වර නාහිමිපාණන් අධිපතිත්වය දරණ කාලයේ විශාල දියුණුවක් ලබා ඇත. දෙමළ බෞද්ධයන්ගේ ආගමික, සංස්කෘතික කටයුතු ඉටු කිරීම ආදි සමාජ මෙහෙවර නිසා ආයතනය සමග දෙමළ බෞද්ධ ජනතාව හොඳ සමගියක්, සහයෝගීතාවක් ගොඩනගාගෙන ඇත. අපේ සිංහල භික්ෂූන් වහන්සේලා මේ ස්ථානවල නොයෙක් දුෂ්කරතා අභියෝග මැද වැඩවාසය කරමින් බෞද්ධ අබෞද්ධ ජනතාවට සලසන පහසුකම් හා කරනු ලබන අති උදාර ශාසනික සමාජීය සේවාවන් පිළිබඳ තරමක අවබෝධයක් මදුරාසි මහාබෝධි මධ්‍යස්ථානය තුළදී ඔබට ලැබිය හැකිය. ආසියාවේ විශාලතම වෙරළ වන මැරීනා බීච් යනුවෙන් හඳුන්වන මුහුදු වෙරළද ඔබට දැකිය හැක්කේ මදුරාසියේදිය.

# සාංචි පුදබිම

මදුරාසි සෙන්ට්‍රල් දුම්රිය පළෙන් දිල්ලි මාර්ගයේ ගමන් ගන්නා දුම්රියකින්, තමිල්නාඩු, ආන්ද්‍රා, මහාරාෂ්ට්‍ර යන ප්‍රාන්ත පසුකරමින් කි. මී. 1484 දුර ගෙවූ පසු මධ්‍ය ප්‍රදේශ වල අගනගරය වන බෝපාල් දුම්රිය පළ හමුවේ. එහි සිට සාංචි නගරයට කි. මී. 46 ක දුරකි.

රතු ගල් වලින් අඩි 300 ක් පමණ උස ඉතා රමණීය කඳු මුදුනක සාංචි පුදබිම දැකිය හැකිය. සෑගිරිය, චේතියගිරිය යන නම් වලින් ද සාංචි පුදබිම හඳුන්වයි. අශෝක යුගයේ සාංචිය අයත්ව තිබුණේ අවන්ති රාජ්‍යයටය. එය අද මධ්‍ය ප්‍රදේශ ප්‍රාන්තයට අයත්වේ. අනුබුදු මිහිඳු මහ

රහතන් වහන්සේ සදහම් දායාදය ලාංකිකයන්ට බෙදා දෙනු පිණිස ලංකාධරණීතලයට වැඩම කළේ සාංචි පුදබිමේ සිටයි. මිහිඳු හිමියන්ගේ මව වන වේදිස දේවියගේ ගමවන වේදිස (විදිසා) නගරය පිහිටා ඇත්තේ ද සාංචි පුදබිමේ සිට කි. මී. 8 කට දුරිනි. සාංචි පුදබිම ලංකාවේ මිහින්තලය සිහියට නංවන තපෝබිමකි. සාංචි බෞද්ධ නිර්මාණයන් ක්‍රි. පූ. 3 වන සියවසේ මෞර්ය යුගයේ ඇරඹුනායි සැලකේ. සාංචි පුදබිමෙහි මහා ස්ථූපය, සැරියුත් මුගලන් ධාතු ස්ථූපය, මොග්ගලී පුත්ත තිස්ස ස්ථූපය යන ස්ථූප තුන හැර තවත් ස්ථූප දහස් ගණනක අත්තිවාරම් ශේෂව ඇත. ශුංග, කුෂාන්, ගුප්ත, සාතවාහන යුග අනුව ක්‍රම ක්‍රමයෙන් කලාත්මකව දියුණු විය. ශුංග යුගය ඇරඹුනේ පුෂ්‍යමිත්‍ර රජුගෙනි. ඔහුගෙන් සාංචි ස්ථූප වලට හානි සිදුවිය. එහෙත් ඔහු පුත් අග්නිමිත්‍ර සාංචි ස්ථූප වටා ගල් වැටවල් කරවූයේය. ගල්වැටවල් වල විසිතුරු ලෙස කැටයම් කරවූයේය. මහා ස්ථූපය කළුගල් වලින් වසා මතුපිට බදාමයක් ආලේප කරවිය. එම ආලේපිත බදාමය අද ද ඔබට දැකිය හැකිය.

සාංචි මහා ස්ථූපය කලාගාරයකි. බෞද්ධ විශ්වකෝෂයකි. මහා ස්ථූපය වටා සිව්දිගින් බුද්ධ චරිතය හා බෝසත් සිරිත (ජාතක කථා) එක් එක් කොටස් අළලා කළ සියුම් කැටයම් සහිත තොරන් හතරකි. ඒ ගල් තොරණ් හතර සිව්දිගින් ස්ථූප මළුවට ඇතුළුවීම සඳහාය. ස්ථූප වටේ අඩි 15 ක් තරම් උස වේදිකාවක් මත ගල්වැටක් සහිත සෝපාන මාර්ග දෙකකි. ඒ මැද ධාන්‍යාකාර ප්‍රදර්ශනය වන ස්ථූපයයි. ස්ථූපය මුදුනේ හතරැස් කොටුව ගල් වැටකින් ආවරණය කොට ඒ මැද ගල් ඡත්‍රයක් නංවා ඇත්තේ බෞද්ධ සම්ප්‍රදායේ මුල් අවස්ථාව පිළිබිඹු කරන්නා සේය.

සංඝමිත්තා තෙරණිය ජයශ්‍රී මහා බෝ ශාඛාව වැඩමකරගෙන ලංකාවට පැමිණෙන තුරු සාංචි පුදබිමේ ඇය වැඩ සිටි අරම සංඝමිත්තා මෙහෙණවර ලෙස අද ද ශේෂව ඇති අයුරු දැකිය හැක. විදිසා මාළිගාවේ සිට සාංචි පුදබිම දක්වා අශෝක රජු කරවූ උමං මාර්ගයක

නටබුන් ද පසෙක ඇත. සාංචිය ද මුස්ලිම් ආක්‍රමණවල විනාශකාරී බලපෑම්වලට ලක්ව ඇත. සාංචි කඳු මුදුනට නැග්ග විට වින්ධ්‍යා කඳු වැටිය ක්ෂිතිජය සිපගන්නා තෙක් දැකිය හැකිය.

ශ්‍රී ලංකා ජනතාවට බුදුදහම මෙන්ම අගනා සංස්කෘතික දායාදයන් රැසක් උරුම කළ සාංචි පුදබිමෙහි මහා බෝධි සමාගම මගින් ඉදිකළ සුවිශේෂ බුද්ධ මන්දිරයකි. සාංචි නගරය තුළ දුම්රියපළට ආසන්නව මහා බෝධි විශ්‍රාම ශාලාවයි. සියළු වන්දනාකරුවන්ට මෙහි නවාතැන් පහසුව ලද හැකිය.

## බරණැස (වාරාණසී)

බෝපාල් දුම්රිය පලේ සිට වාරාණසි දක්වා දිවෙන දුම්රියෙකින් කි. මී. 816 ක දුර ගෙවූ පසු වාරාණසි දුම්රිය පල හමුවේ. එහි සිට කි. මී. 12 ක දුර ගෙවා (සාරානාථ්) ඉසිපතන මිගදය පුදබිමට පැමිණිය හැකිය. වත්මන් බරණැස් නගරය වාරාණසි බෙණරිස් බරණැස කාශි යන නම් වලින් හඳුන්වනු ලබයි.

## චෞකණ්ඩි චෛත්‍යය (සම්මුඛ චේතිය)

තථාගතයන් වහන්සේ බුද්ධගයාවේ සිට ගව් 18 ක් මග ගෙවා ස්වකීය මංගල ධර්මදේශනාව පස්වග තවුසන් හමුවේ පැවැත්වීමේ අදහසින් බරණැස, ඉසිපතන මිගදය බලා වැඩම කළහ. පස්වග තවුසන් බුදුරජාණන් වහන්සේට හමුව සාකච්ඡාකළ ස්ථානය, සම්මුඛ වූ ස්ථානය, සම්මුඛ චෛත්‍යයයි. ධර්මාශෝක අධිරාජයා මෙහි විශාල ස්තූපයක් කරවූ අතර මුස්ලිම් ආක්‍රමණයට ඉන්දියාව යටත් වූ කාලයේදී කිසියම් සිහිවටනයක් 16 වෙනි සියවසේදී අක්බාර් රජු විසින් චෛත්‍ය මුදුනේ කරවා ඇති අයුරු අදත් දැකිය හැකිය. ඉසිපතන මිගදයට කි. මී. 1 ක් පමණ දුරින් ප්‍රධාන මාර්ගය අසල මේ ස්තූපය පිහිටා ඇත.

# ධම්මික චෛත්‍යය

ධම්ම චක්ක පවත්තන සූත්‍රය ශ්‍රවණය කළ පස්වග තවුසෝ දින පහක් තුළ පිළිවෙලින් සෝවාන් වූහ. හයවන දින තථාගතයන් වහන්සේ මේ පස්දෙනා අමතා අනත්ත ලක්ඛණ සූත්‍රය දේශනා කිරීමෙන් ලෝකයාට මුල්ම රහතුන් පස් නම පහළ විය. මේ නිසා මේ උතුම් භූමිය ශ්‍රද්ධාවන්තයින්ගේ අප්‍රමාණ ගෞරවයට පාත්‍ර විය. මෙම ස්ථානයේ ධර්මාශෝක රජතුමා ඉදිකළ ස්ථූපය ධම්මික ස්ථූපයයි. ගලෙන් නිමවා ඇති මේ ස්ථූපය ද මුස්ලිම් ආක්‍රමණයට අසු වූවත් තවමත් ස්ථූපයේ ස්වරූපය එසේම පවතී. ඒ අතර කාශි, වාරාණසි යන නම් වර්තමානයෙහි වැඩි වශයෙන් ව්‍යවහාර වේ. වාරාණසී නගරය දෙපසින් ගලන වරුණ, අස්සි යන ගංගා දෙක නිසා මෙය වාරාණසි නම් විය. අද වාරාණසි උත්තර ප්‍රදේශ ප්‍රාන්තයට අයත්ය. ඉසිපතනය යනු ඍෂිවරු පතනය වන බසින ලද ස්ථානයයි. ඍෂිවරු හිමාලය ආශ්‍රිත වනාන්තරවල සිට නගරයට පැමිණෙන කාලවල දාර්ශනික සාකච්ඡා සඳහා එකතුවන ශාන්ත පරිසරයකි. ඍෂි බිම නිසාත් අපේ බුදුපියාණන් වහන්සේගේ උත්පත්තියට ඉඩදී පසේ බුදුවරුන් 500 නමක් එකවිටම පිරිනිවන් පා මෙහි පතිත වූ හෙයින් ඉසිපතන නමින් ව්‍යවහාර වන බව කියවේ.

මුව වනය මිගදය නම් වේ. මෙහි මුවන්ට අභය දානය ලැබුණු අයුරු රසවත් කතා පුවතකි. අදත් මේ ප්‍රදේශය මුවන්ට අභය දානය ලැබුණු අර්ථයැතිව සාරානාථ නමින් ව්‍යවහාර වේ. එදා මිගදය සංකේතවත් කරනු වස් අදත් විශාල මුව රංචුවක් සහිත අභය භූමියක් ඉසිපතන බිමේ කෙළවරක දැකිය හැකිය.

සිදුහත් බෝසතාණන් වහන්සේ බුදු රද පදවි ලැබ තුන් ලොව සනහා පන් සාලිස් වසක් දහම් දෙසීමට, එම මඟුල් දම්සක මුදහලේ ඉසිපතන මිගදය පිං බිමේදීය. ක්‍රි. පූ. 590 ඇසළ පුන් පොහෝ දින හිරු බැස ක්ෂිතිජයෙන් සඳ නැග එද්දී බුද්ධෝත්තමයන් වහන්සේ පස්වග තවුසන් අමතා දම්සක් පැවැතුම් සූත්‍ර දේශනාව ආරම්භ කළේ ඉසිපතන මිගදය

පිංබිමේදීය. මිනිසුන් පස්දෙනෙක් ද හැටකෝටියක් දිව්‍ය බ්‍රහ්මයන් ගේ ද මන පිනවමින් ශාන්තිනායකයාණෝ බ්‍රහ්ම ස්වර විහිදුවා දේශනා කර වදාළ ධම්ම චක්ක පවත්තන සූත්‍රය ශ්‍රවණය කළ පස්වග තවුසන් අතරින් කොණ්ඩඤ්ඤ තවුස් තෙමේ සිව් සස් අවබෝධ කළහ. තුණුරුවන් එක තැන දිස්වුණු අසිරිමත් බිම මිගදායයි. සියළු බුදුවරු අත්නොහරින (අවිජහිත) ස්ථාන හතරෙන් එකකි. බුදුරජාණන් වහන්සේගේ පළමු වස් විසුම ද ඉසිපතනයේ විය.

## ධම්මරාජික චෛත්‍යය

පස්වග තවුසන් මුණගැසුන පසු බුදුරජාණන් වහන්සේ මංගල සම්මත දම්සක් සුතුර දේශනා කිරීම සඳහා ඉසිපතන මිගදායට වැඩම කළහ. එදා ඇසළ පුණු පොහෝ දින ධම්ම චක්ක පවත්තන සූත්‍රය දේශනා කළ ස්ථානයෙහි ක්‍රි. පූ. 3 වන සියවසේ දී සර්වඥධාතු නිධන් කොට අශෝක අධිරාජයා විසින් අඩි 46 අඟල් 3 ක් උසට ස්ථූපයක් කරවන ලදී. එම ස්ථූපය ධම්මරාජික ස්ථූපයයි. ධර්මාශෝක රජතුමා මෙම ස්ථූපය තුළ ධම් චක්‍ර මුද්‍රාවෙන් එක් පිළිම වහන්සේ නමක් හා සෙල් ලිපියක් තැන්පත් කර තිබූ බව විශ්වාස කෙරේ. දැනට මෙම ස්ථූපයේ අඩිතාලම පමණක් දැකිය හැකිය.

## දම්සභා මණ්ඩපය

පස්වග තවුසන් වහන්සේලා රහත්වීමෙන් පසු දින රාත්‍රී බුදුරජාණන් වහන්සේ විවේක සුවයෙන් සිටින අතර සසර පිරූ පාරමී ඇති බරණැස් සිටුපුත් යස තෙමේ මිගදායට ආවේය. බුදුරදුන් හමුවේ බණ ඇසූ ඔහු පැවිදි විය. ඔහු සොයා ආ සිටු දෙමහල්ලන් හා පැරණි බිරිඳ ද තුණුරුවන් සරණ ගියහ. යසගේ යහළුවන් 54 දෙනෙකු ද පැවිදි විය. මේ සියල්ල සිදු වූ ස්ථානය දම්සභා මණ්ඩපයයි. ධර්මාශෝක රජතුමා මෙම ස්ථානයේ අලංකාර කැටයම්වලින් යුත් ආසනයක් තනවන ලදී. මුස්ලිම්

ආක්‍රමණිකයන් විනාශ කළ එහි ඉතිරි කොටස නැසීගිය ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නේරුතුමා විසින් ආරක්ෂාකර ආවරණයක් තනවා ඇති අතර අදත් මේ ආසනය දැකිය හැකිය.

## පැරණි මූලගන්ධකුටි විහාරය

බුදුරජාණන් වහන්සේ සැට නමක් රහතන් වහන්සේලා සමඟ බරණැස ඉසිපතන මිගදාය බිමේ පළමු වස් කාලය ගත කළ සේක. එකල පරිසරය අනුව කොළ අතු සෙවිළිකළ ආවරණ තුළ උන්වහන්සේලාට වස් විසීමට ලැබුණි. කොළ අතු සෙවිළි කළ නිසා පංසල යන නම ව්‍යවහාර විය. බුදුරදුන් සඳහා කළ ගෘහය විහාරය නමින් හඳුන්වන ලදී. මේ අයුරින් ප්‍රථම වස් විසීම සඳහා කරවන ලද විහාරය මූලගන්ධකුටි විහාරය නමින් හඳුන්වනු ලැබේ.

තථාගතයන් වහන්සේ පිරිනිවන් පා වසර 236 කට පසුව රජ පැමිණි ධර්මාශෝක මහා රජතුමා බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් අංග සම්පූර්ණ විහාරයක් ගඩොලින් තනවන ලදී. ශිලා ලේඛනයන් ද පිහිටුවා ඇත. විහාරය තුළම සක්මන් මළුව, විවේක ගෘහය අග්‍රශ්‍රාවකයන් වහන්සේලා සඳහා කුටි යනාදිය තනවා තිබුණි. මුස්ලිම් ආක්‍රමණයට හසුවූ මූලගන්ධකුටි විහාරයේ අද ඇත්තේ විශාල භූමි භාගයක් පුරා විසිරී ඇති නටබුන් පමණි.

## භූගත චංක්‍රමණය

පෙර වැඩ සිටි භික්ෂූන් වහන්සේලා සක්මන් භාවනාව සඳහා ප්‍රයෝජනයට ගත් සක්මන් මළුවෙකැයි කියන පොළවයට පිහිටි සක්මන් මළුවකි. සිහියෙන් යුතුව සක්මන් කිරීමට අඳුර මැද ආලෝකය ලැබෙන අයුරින් නිමවා ඇත.

# මුව වනය

මිගදය සංකේතවත් කිරීමට තනන ලද මුව වනයයි. සිය ගණනක් මුවන් මෙහිදී ඔබට දැකිය හැකිය. මුවන්ගේ සුරතල් දකින්නන්ගේ සිත් පිනවන සුළුය.

# නව මූලගන්ධකුටි විහාරය

භාරතයේ ධර්මාශෝක අධිරාජයාගෙන් පසුව සම්බුද්ධ ශාසනයට තම ජීවිතය කැප කළේ ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා බවට විවාදයක් නැත. 20 වන සියවසේ ශ්‍රී ලංකාවේ පහළ වූ ශ්‍රේෂ්ඨතම සිංහල යුගපුරුෂයා හැටියට නම් කළ හැකි ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා සිය ජීවිතයේ අවසන් මොහොත දක්වාම සාරානාථයට විශේෂ සේවයක් සිදුකළේය.

මේරි ෆොස්ටර් රොබින්සන් මැතිණියගේ සහ බෞද්ධ සැදැහැවතුන්ගේ නොමඳුරු ආධාරය ඇතිව පැරණි මූලගන්ධකුටි විහාරයේ සැලැස්මට අනුව ශෛලමය මූලගන්ධකුටි විහාරය කරවන ලදී. ඉන්දීය ආණ්ඩුවෙන් ලැබුණු (නාගර්ජුන කොණ්ඩයෙන් හමුවූ) සර්වඥධාතු පිළිම වහන්සේ වැඩසිටින ආසනය යට ආරක්ෂිතව තැන්පත් කොට ඇත. ධර්මචක්‍ර මුද්‍රාවෙන් යුත් නව මූලගන්ධකුටි විහාරයේ ප්‍රතිමා වහන්සේ නෙළන ලද්දේ ඉන්දීය මූර්ති ශිල්පියෙකු විසිනි. බුරුම රජයේ අනුග්‍රහයෙන් ප්‍රතිමාවේ රන් ආලේපිතය. විහාරයේ බිත්ති වල චිත්‍ර ඇඳ ඇත්තේ ජාත්‍යන්තර කීර්තියට පත් ජපන් ජාතික කොසෙට්සු නෝසු ශිල්පියා විසිනි. බුද්ධ ප්‍රතිමා වහන්සේ පිටුපස සිරිදේවමිත්ත ධර්මපාල හිමියන්ගේ (ධර්මපාලතුමාගේ පැවිදි නම) භස්මාවශේෂ තැන්පත්කොට ගෞරව කරනු ලැබේ. 1932 නව මූලගන්ධකුටි විහාරය විවෘත කරනු ලැබීය. දැනටත් මෙහි සෑම දිනකම රාත්‍රී 7.00 ට පමණ තෙරුවන් වැඳ ධම්ම චක්ක සූත්‍ර දේශනාව පවත්වනු ලැබේ.

# ජය ශ්‍රී මහා බෝධි ශාඛාව

නව මූලගන්ධකුටි විහාරය විවෘත කිරීම නිමිති කොටගෙන ශ්‍රී ලංකාවේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාවක් වැඩමවා 1932 වර්ෂයේදී මූලගන්ධකුටි විහාර බිමේ ධර්මපාලතුමා විසින් රෝපණය කරවන ලදී. විහාරය දකුණු පැත්තේ මෙය පිහිටා ඇත. අද එය විශාල බෝධිප්‍රාකාරයක් සහිතව දර්ශනීය අයුරින් සකස් කොට ඇත. බෝධීන්වහන්සේ ඉදිරිපස බුරුම රජය මගින් බුදුරදුන් පස්වග තවුසනට මංගල ධර්මදේශනාව පවත්වන අයුරු දැක්වෙන ප්‍රතිමා නිර්මාණය කොට තිබේ.

# ධර්මපාල ස්මාරකය

සම්බුද්ධ ශාසනය වෙනුවෙන් ම සිය ජීවිතය පූජා කළ සිරි දේවමිත්ත ධර්මපාල හිමිපාණන්ගේ දේහය ආදාහනය කළ ස්ථානයෙහි ගොඩ නගා ඇති ස්මාරකය මිගදය උයනේ කෙළවරක දැකිය හැකිය. එහි යන බොහෝ දෙනා මොහොතක් නිහඬව හිසනමා දම්පල් ගුණ සිහියට නගන අයුරු නිතර දක්නට ලැබේ. මේ ස්ථානයට පහළින් කුරුල්ලන්ගෙන් යුත් පුංචි සත්තු වත්තකි.

# ධර්මපාල කෞතුකාගාරය

ධර්මපාලතුමා සිය ජීවිතයේ අවසානය දක්වාම පරිහරණය කළ ලිපි ලේඛන, විවිධ භාණ්ඩ, ඡායාරූප මෙහිදි දැකිය හැකිය. එතුමා ගැන ලියැවුණු බොහෝ ලේඛන මෙහි තැන්පත්ව ඇත. කෞතුකාගාරය නැරඹූ පසු ධර්මපාලතුමාගේ ජීවිතය පිළිබඳව මනා අවබෝධයක් ලැබිය හැකිය.

## සාරානාථ් කෞතුකාගාරය

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් පාලනය කෙරෙන සාරානාථ් කෞතුකාගාරය තුළ ඉසිපතන මිගදය බිම කැණීමේ දී හමුවූ විවිධ මුද්‍රාවලින් යුත් බුද්ධ ප්‍රතිමා ඡත්‍ර ආදි කෞතුක වස්තු නැරඹිය හැකිය.

## අශෝක කුළුණ

අශෝක රජතුමා ධර්ම යාත්‍රාවේ යෙදුන සෑම සිද්ධස්ථානයකම එකී ස්ථානයේ වැදගත්කම එහි පැමිණි කාලය, බුදුදහම පිළිබඳ තමාගේ අදහස් ද ගල් කණුවල කොටන ලදී. බුද්ධගයා විශාලා කුසිනාරා සාරානාථ් සාංචි ආදි ස්ථානවල මෙසේ පිහිටුවා ඇති සෙල්ලිපි සහිත අශෝක කුළුණු දැකිය හැකිය. සාරානාථයේ ඇති අශෝක කුළුණු හිසේ සිංහ රූප හා ධර්මචක්‍ර වත්මන් ඉන්දියාවේ රාජ්‍ය ලාංඡනය ලෙස යොදා ගෙන තිබීම එතුමාගේ අමිල සේවය ලෝකයාට පුන පුනා ප්‍රකාශ කිරීමකි. මුස්ලිම් ආක්‍රමණයට හසුවූ සාරානාථ් අශෝක කුළුණ ද විනාශ වූවත් සෙල්ලිපිය විනාශ වී නොමැත. කුළුණේ සිංහ හිස සහිත උඩ කොටස සාරානාථ් කෞතුකාගාරයෙහි සුරක්ෂිතව තබා ඇත. කුළුණේ ඉතිරිව ඇති යට කොටස නැසීගිය අග්‍රාමාත්‍ය ශ්‍රී නේරුතුමා විසින් ශෛලමය ආවරණයක් තනවා ආරක්ෂා කර ඇත.

## හරිශ්චන්ද්‍ර ඝාට් (ගංගා නම් ගඟේ මිනී දවන ස්ථානයකි.)

ගංගා නම් ගඟේ ජලය හින්දූන් සලකන්නේ ශුද්ධ ජලය වශයෙනි. ගංගා නම් ගඟේ ඇරඹීම මහාබ්‍රහ්මයාගේ මහපට ඇඟිල්ලෙන් යැයි ඔවුන් විශ්වාස කරති. බ්‍රහ්මත්වය පතන හින්දූන් මළ පසු මිනිය පුළුස්සා අළු ගඟට දමති. මෙවැනි මිනී දමන පුණ්‍ය තීර්ථ රාශියක් ගංගා නම් ගඟ අයිනේ ඇත. දර ස්වල්පයක් භාවිතා කොට උණ ලී වලින් පෙරල පෙරලා මිනී දැවීම කරති. තරමක් කරවූ මිනී ගඟට තල්ලු කරති. මෙය

හින්දූන්ගේ උසස් චාරිත්‍ර ධර්මයකි. දිනකට මිනී 25-30 මෙසේ පුළුස්සා ගඟට දමන බව පෙනේ. මේ ඉන්දියානු සංස්කෘතික ලක්ෂණය ඔබට අළුත් අත්දැකීමක් විය හැකිය.

# බ්‍රහ්මදත්ත මාළිගාව

සාරානාථ වල සිට බරණැස් නගරය හරහා ගොස් ගංගා නම් ගඟෙන් එතරව (රාජඝාට් ගංගා නම් ගඟෙන් එතෙරවන විශාල පාලම.) කි. මී. 5 ක් පමණ ගිය විට වර්තමාන රාම් නගරය හමුවේ. යටගිය දවස බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකු යැයි අප බොහෝවිට කියන ජාතක කථාවල සඳහන් බ්‍රහ්මදත්ත මාළිගාව අදත් දැකිය හැකිය. අද මෙය කෞතුකාගාරයක් ලෙස කොටසක් පිළියෙල කොට ඇත. කසී රට බ්‍රහ්මදත්ත පරපුර තවමත් ජීවමානය. දැනට සිටින රජතුමා ඉතා වෘධය. එතුමා ප්‍රවේණි උරුමය අනුව බරණැස් විශ්ව විද්‍යාලයේ කුලපති වන්නේය. බරණැස් පරම්පරාවේ පැරණි භාණ්ඩ ප්‍රදර්ශනය පිණිස තබා ඇත. සිංහාසන මැදිරිය අන්තඃපුරය අදත් දැකිය හැකිය. විවිධ අවි ආයුධ රාශියක් තැන්පත් කොට ඇත. ගංගානම් ගඟ ඉවුරේ සිට ගොඩනගා ඇති මාළිගාව සහිත ප්‍රදේශය අක්කර 5 ක් තරම් විශාලව පැතිරී ඇත. මාළිගා භූමියට ඇතුළුවන ප්‍රධාන දොරටුව අද ද මාළිගා රැකවලුන්ගෙන් ආරක්ෂිතය.

රජු මාළිගාව තුළ සිටී නම්, රතු පැහැ පසුබිමක සුදු පැහැති මත්ස්‍යයින් දෙදෙනෙකු සහිත රාජකීය ධජය ලෙලදෙනවා ඇත.

# බුද්ධගයාව

වාරාණසී වල සිට කි. මී. 265 ක් දුර ගමන් කළ විට බිහාර් ප්‍රාන්තයේ නේරංජරා ගඟ අසබඩ පිහිටි බුද්ධගයාව හමුවේ. මේ පැරණි මගධ රාජ්‍යයයි. බුද්ධගයාව සෑම බෝසතාණන් වහන්සේ නමක් ම බුද්ධත්වයට පත් උතුම් පූජාභූමියයි. අපේ ගෞතම තථාගත බුදුපියාණන් වහන්සේ ද බුද්ධත්වයට පත්වූයේ මේ බුද්ධගයා ශුද්ධ භූමියේය. මේ මහා

පෘථිවියෙහි බුද්ධත්වයේ ගරුත්වය දරීමට සමත් වෙනත් තැනක් තවත් නැත. ගයා ශීර්ෂයේ බෝධි වෘක්ෂය පිහිටි තැන පෘථිවියේ නාභිය වන්නේ එහෙයිනි. පුරාණයේ විසූ ගයා නම් ඍෂිවරයෙකු නිසා මේ නම ඇති විය. අවිජහිත ස්ථාන යන්ගෙන් එකකි.

## ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ

තිලෝගුරු බුදුපියාණන් වහන්සේ සමතිස් පෙරුම් දම් බලයෙන් සකල මාරයින් පරාජය කොට අනන්ත ලෝකධාතු කම්පා කරවමින් නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය අවබෝධ කොට වදාළේ ශ්‍රී ජය ශ්‍රී මහා බෝධි මූලයේදීය. මහා බෝධීන් වහන්සේ සිදුහත් උපත සමඟ ලොව පහළ වූ සහජාත වස්තූන්ගෙන් එකකි. අවුරුදු දෙදහස් පන්සියයකට වැඩි කාලයක් මුළුල්ලේ අප්‍රමාණ භික්ෂු පැවිදි, ගිහි, රජ, සිටු, සාමාන්‍ය, බෞද්ධ, අබෞද්ධ ජනතාවගේ විශේෂ ගෞරව සම්මාන පූජා සත්කාර ලැබූ පූජාර්හ වෘක්ෂ රාජයාණන්ය. සිදුහත් බෝසතාණන් වහන්සේ කලියුග වර්ෂයෙන් 2513 වැන්නෙහි පුර පසළොස්වක් දින මෙම බෝධි මූලයේදි සම්මා සම්බුද්ධත්වයට පත්වූහ. ශ්‍රී ලංකාවේ ශ්‍රීමත් ආර්. ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමා ලාංකිකයන් වෙනුවෙන් ශ්‍රී මහා බෝධීන් වහන්සේ වටා විශේෂ රන් වැටක් සහ වජ්‍රාසනයට රන් ආලේපිත සෙවිල්ලක් කරවා තිබීම මුළු මහත් ලංකාවටම සුවිශේෂ ගෞරවයක් වී ඇත.

## වජ්‍රාසනය

බුදුරජාණන් වහන්සේ ලොව්තුරා බුද්ධ රාජ්‍යයට පැමිණ වදාළ එම ස්ථානයෙහි ධර්මාශෝක මහරජතුමා විසින් කැටයම් සහිතව නිර්මාණය කළ ගල් අසුන අදත් ඔබට දැකිය හැකිය. එම වජ්‍රාසනය අඩි 7 යි අඟල් 6 ක් දිග, අඩි 4 යි අඟල් 10 ක් පළල අඩි 3 ක් උසය.

# බුද්ධගයා මහා විහාරය

ක්‍රි. පූ. 250 දි ධර්මාශෝක මහරජතුමා විසින් මේ විහාරය කරවූ බව ආචාර්ය කනිංහැම් පුරාවිද්‍යාඥයා කියයි. වජ්‍රාසනය ඉදිරියෙන් වූ ස්ථූපය තුළ මැද විහාරයකි. එහි භූමි ස්පර්ශ මුද්‍රා පිළිමයකි. රන් ආලේපිතය. නැගෙනහිර දෙසට මුහුණලා මූර්තිමත් කොට ඇති ප්‍රතිමාව ආනුභාව සම්පන්නය. ධර්මාශෝක මහරජතුමා මැටි ගඩොල් වලින් ගොඩ නැගූ මෙම ස්ථූපය ක්‍රි. ව. 450 දී බුරුම ජාතික සාඩෝ රජතුමා ප්‍රතිසංස්කරණය කරවා ඇත. අනතුරුව ඒ ඒ රාජ්‍ය යුගවලදි විවිධ රජවරුන්ගේ අනුග්‍රහය ලැබ ස්ථූපය වැඩි දියුණු වී ඇතත් මූලික සැලසුම් වෙනස් වී ඇති බවක් නොපෙනේ. ක්‍රි. ව. 1893 දී ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා මහාබෝධි සමාගම පිහිටුවා ස්ථූපය රැකගැනීම පිණිස ජීවිත පරිත්‍යාගයෙන් ක්‍රියා කළේය. අඩි 160 ක් පමණ උස්වූ ස්ථූපයේ පැත්තක් අඩි 50 ක් දිග චතුරාස්‍රයකි. තට්ටුවෙන් තට්ටුව ඉතාම විසිතුරු ලෙස පිළියෙල කළ කවුළුවල විවිධ මුද්‍රා වල බුද්ධ ප්‍රතිමා තැන්පත් කොට තිබී ඇතත් අද ඒවා බොහෝදුරට හිස්ව ඇති බව පෙනේ. බුද්ධගයා ස්ථූපයඅවට සත්සති ගත කරණ ලද ස්ථාන ඉන්දීය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සටහන් සහිතව දැකගත හැකිය.

# සුජාතා මාළිගාව

නේරංජරා නදියෙන් එතෙර පිහිටි මෙම ස්ථානය පැරණි ගඩොල් සහිත පුංචි කඳුගැටයක් ලෙස දැකිය හැකිය. අශෝක රජතුමා මෙම ස්ථානයේ ස්ථූපයක් කළබව පැවසේ. උරුවෙල් දනව්වෙහි පැරණි සේනානි ගම අද බකරෝජ නමින් ව්‍යවහාරවේ.

# කිරිපිඬු පූජාකළ ස්ථානය

මේ ස්ථානය කරා පා ගමනින් යා යුතුය. බුද්ධගයාවේ සිට කි. මී. 3 ක පමණ දුරකි. නේරංජරා නදිය අසල පිහිටා ඇත. ඉතා පැරණි නුග රුකක් අසල සුජාතාව කිරිපිඬු පූජා කරණ ආකාරය දැක්වෙන ප්‍රතිමා

නිර්මාණය කොට ඇත.

## පාත්‍රය ගඟට දැමූ ස්ථානය

කිරිපිඬු වළඳා අවසානයේ දි බෝසතාණන් වහන්සේ මම අද බුදුබවට පත්වේ නම් පාත්‍රය උඩුගං බලා යා යුතුයැයි කලිය නේරංජරා ගඟ දිය මත තැබූ ආකාරයෙන් බුරුම බෞද්ධයන් විසින් තනවා ඇති ප්‍රතිමාවක් මෙහි දක්නට ඇත.

## සොත්ථිය බමුණා කුස තණ පිදූ ස්ථානය

සුජාතාව පූජාකළ කිරිපිඬු වළඳා බුද්ධගයාවට වැඩම කරවන අතරමග නේරංජරා නදි සමීපයේදි බෝසතාණන් වහන්සේට සොත්ථිය බමුණා මුණ ගැසිනි. එහිදි ඔහු කුස තණ අට මිටක් පූජා කළ අයුරු දැක්වෙන ප්‍රතිමාවක් අද මෙම ස්ථානයෙහි දැකිය හැකිය.

**ගිණිහල් ගෙය:** තුන්බෑ ජටිලයන් දමනය කළ ස්ථානය.

## දුර්ගේශ්වරී හෙවත් දුෂ්කර ක්‍රියා කළ ස්ථානය

බුද්ධගයාවේ සිට කි. මී. 15 ක් පමණ දුර ගිය විට උරුවෙල් ජනපදයේ ඉහළම කෙළවරේ නිසරු පෙදෙසක පිහිටි කඳුවැටියක මේ ස්ථානය පිහිටා ඇත. ඉතා දුෂ්කර ගමණකින් ළඟාවිය යුතු ස්ථානයකි. දැනට ටිබෙට් ලාමවරු වැඩවසන පූජනීය ආරාමයකි. එහි ඇති ගල් ගුහාවක බෝසතුන් දුෂ්කරක්‍රියා සමයෙහි වැඩවාසය කොට ඇත. ඉතාම දුගී මිනිසුන්ගෙන් පිරුණ ප්‍රදේශයකි.

## රජගහ නුවර

බුද්ධගයාවේ සිට කි. මී. 80 ක් පමණ දුර ගමන් කළ පසු එදා මගධ රාජ්‍යයේ අගනගරය වූ රජගහ නුවර හමුවේ වර්තමානයේ රාජ්ගිරි නමින් ව්‍යවහාරය ගිජ්ජකූට, පාණ්ඩව, ඉසිගිලි, වේභාර, වේපුල්ල යන

කඳු වළල්ලෙන් වටවූ ආරක්ෂිත නගරයකි. බුද්ධ කාලයේදි බිම්බිසාර අජාසත්ත රජවරුන් පාලනය කරණ ලදි. රජගහ නුවරට ඇතුළු වන විට නගරය වටා බැඳි පැරණි ප්‍රාකාරය දැකිය හැකිය.

වේළුවනාරාමය, ගිජ්ජකූළු පව්ව, ඉසිගිලි පර්වතය මද්දකුච්චිය, ජීවකාම්බවනාරාමය, කලන්දක නිවාසය, මෝරනිවාසය, පිප්පලි ගුහාව, සත්තපණ්ණි ගුහාව, උදුම්බරිකාරාමය, ශීතවනය, පරිබ්බාජකාරාමය, වේදිසාගිරිය, ඉන්ද්‍රසාල ගල්ගුහාව, පාසාණ චේතිය, ලට්ඨිවනය, සුමගධ වැව, බුදුරදුන් වරින් වර රජගහ නුවර වැඩ සිටි ස්ථාන කීපයකි. අද මේ සියල්ල නටබුන් ලෙස දැකිය හැකිය.

## විඩූඩභ රජුගේ රථ එරුණ තැන

ශාක්‍ය රජවරු තමා පිළිකුල් කරන බව දැනගත් විඩූඩභ රජතුමා ශාක්‍ය රජවරු විනාශ කිරීම පිණිස යුද්ධයට නික්ම ගියහ. රජගහ නුවර හරහා යන විට වේළුවනාරාමයෙහි වැඩ සිටි බුදුරජාණන්වහන්සේ සිය ඥාතීන්ට විඩූඩභ රජුගෙන් වන විපත දුටු සේක. එය වළක්වාලීම පිණිස යුද්ධ රථ සියල්ලම ගල්තලාව මත එරී යන ලෙස අධිෂ්ඨාන කරණ ලදී. ඒ අනුව රථ සියල්ලම ගලේ එරීම නිසා ගමන වැළැක්විනි. එරුණු රිය සකෙහි ගමන් මාර්ගයේ සලකුණු නොමැකෙන ලෙස ආරක්ෂා කරමින් ගල්තලාව අදත් එම ආශ්චර්යවත් කථා පුවෘත්තිය අපට පවසයි.

## ජීවක අඹ වනය

ගිජ්ජකූටයෙන බැස ඉදිරියට එනවිට ජීවක අඹ වනය හමුවෙයි. බුදුරදුන් ගිලන් වූ විට බෙහෙත් කරන්නට පෙරුම්පුරා ගෙන පැමිණි ජීවක වෙදතුමා තමාගේ අඹ උයනේදි බුදුරජාණන් වහන්සේට සිවෙයාභක වස්ත්‍ර යුගලයක් පිදිය. වස්ත්‍ර පූජානිශංස ඇසූ ජීවක තුමා සෝවාන් විය. උන්දෑ සඳහා බුදුරදුන් පිදිමට වේළුවනය දුර බැවින් අඹ උයනෙහි ආරාම කරවා පූජා කළේය. මෙය ජීවකාම්බවනාරාමය නමින් ප්‍රසිද්ධ විය.

දේවදත්තගේ වසඟයට ගිය අජාසත්ත රජු සම්‍යක් දෘෂ්ටික වූයේද ජීවක විසින් තම ආරාමයෙහි වැඩවිසූ බුදුරදුන්වෙත කැඳවාගෙන ගොස් සාමඤ්ඤඵල සූත්‍රය ඇසීමෙන්ය.

# ගිජ්ජකූට පර්වතය

ගිජ්ජකූට කඳුගැටය නැගීම එතරම් වෙහෙසකර නොවේ. පියාපත් විදහාගත් ගිජුලිහිණියෙකුගේ සහ ලැග සිටින්නාවූ ගිජුලිහිණියෙකුගේ ආකාරය දැක්වෙන ගල් කුළු වලින් යුතුව පිහිටා ඇති නිසා ගිජුකුළු පව්ව යන නම ලැබී ඇත. බිම්බිසාර රජතුමා විසින් බුදුරජාණන් වහන්සේ සඳහා ගිජුකුළු පව්ව මුදුනේ විහාරයක් කරවා දෙන ලදී. කඳු මුදුනේ හතරැස්ව බඳින ලද කොටසකි. ඒ ස්ථානයට පර්වතයෙහි ඇතුලතින් පැමිණිය හැකිකේ පඩි පෙළක් ද වූ අතර බුදුපියාණන් වහන්සේ පර්වතයට ඒ උමඟ තුළින් වැඩි බව සිතිය හැකිය. සිව්වරම් දෙවියන් විසින් සිව්වනක් පිරිසගේ ආරක්ෂාව සඳහා රචනා කරන ලද ආටානාටිය සූත්‍රදේශනාව බුදුරදුන් අනුමත කර වදළේද ගිජ්ජකූට පර්වතයේදිය. පර්වතයෙහි පැත්තකින් බුදුරජාණන් වහන්සේ සක්මන් කළ ස්ථානය දැකිය හැකිය. එහිදි සිදුවූ සංවේගජනක සිදුවීම දේවදත්ත තෙරුන් විසින් බුදුරජාණන් වහන්සේගේ හිස මතට ගලක් පෙරළීමය. ආනන්ද කුටිය, මුගලන් කුටිය, සැරියුත් හිමියන් රහත්වූ ස්ථානය දීඝනඛ පරිබ්‍රාජකයාට වේදනා පරිග්‍රහ සූත්‍රය දේශනා කළ සූකර කත ලෙන ආදිය ද මාර්ගය අසළ දැකිය හැකිය. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය බුදුරජාණන් වහන්සේ දේශනා කළේ මෙහිදි යැයි මහායානිකයන් පිළිගෙන ඇති බැවින් ඔවුන් ගිජ්ජකූටයට දක්වන්නේ ඉමහත් ගෞරවයකි. පර්වතයෙහි එක් පසෙක ඉහළ කඳු ගැටයක් මත සාම දාගැබ ඉදිකිරීමෙන් ඒ බව ඔවුන් සනාථ කොට ඇත.

## සාම චෛත්‍යය

ජපන් රජය විසින් තනවන ලද විදුලි පුටු මාර්ගයෙන් යාමට හැකි පර්වත මුදුනේ විශ්ව ශාන්ති ස්ථූපයයි. මෙම ස්ථූපයෙහි සතර පැත්තේ සිදුහත් උපත, බුදුවීම, ප්‍රථම ධර්මදේශනාව පැවැත්වීම, පරිනිර්වාණය නෙලා ඇත. ප්‍රතිමා රන් ආලේපිතය. ජපන් බෞද්ධ විහාර මන්දිරය ද මෙහිදී නැරඹිය හැකිය. පහළින් ගිජ්ජකූටය ඉතාම විසිතුරු ලෙස දර්ශනය වේ.

## බිම්බිසාර සිරගෙය

ගයා රාජ්ගිරි මාර්ගයෙහි පසෙක අජාසත් රජු විසින් සිය පිය රජු වන බිම්බිසාර රජතුමා හිරකර තැබූ ස්ථානය හමුවේ. මෙහි තිබී හමුවූ මාංචු කුට්ටමක් හා යකඩ දම්වැල් ආදිය නාලන්ද කෞතුකාගාරයෙහි තැන්පත් කර ඇත. සිරමැදිරියට ගිජ්ජකූට පර්වතයෙහි බුදුරදුන් සක්මන් කරන මළුව පෙනේ. සිරගෙයි අප්‍රමාණ පීඩාවට පත් බිම්බිසාර රජතුමාට තිබූ එකම සැනසිල්ල වූයේ බුදුපියාණන් වහන්සේ ගිජුකුළු පව්වෙහි සක්මන් කරන දර්ශනය බව කියැවේ. මරණයෙන් පසු බිම්බිසාර රජතුමා ජනවසභ නමින් වෙසමුණි රජුගේ රාජසභාවට පැමිණි බවත් බුදුරදුන් දක්නට පැමිණ සියළු තොරතුරු පවසා ස්තෝත්‍ර පවත්වා පැදකුණු කොට සකසා වැඳ අතුරුදහන් වූ බවත් දීඝ නිකායේ ජනවසභ සූත්‍රයේ සඳහන්ව ඇත.

## වාල සංඝාට ස්ථූපය (මහා ස්ථූපය.)

රාජ්ගිරි ගයා මාර්ගයෙහි දකුණු පස තාප්පයකින් වටකොට ඇති අද මනියාර් මාතා නම් ස්ථානය එදා මහා ථූපය නමින් හැඳින්වුන ධාතු ගර්භයයි බුද්ධ පරිනිර්වාණයෙන් පසු රජගහ නුවරට අයිති ධාතුන් වහන්සේලා ලැබුණේ මගධාධිපති අජාසත්ත රජුටයි. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ උපදෙස් පරිදි අජාසත්ත රජු විසින් එම ධාතුන් වහන්සේ තැන්පත් කොට ඉතා අප්‍රකට ලෙස හා ආරක්ෂිත ලෙස බඳින

ලද ස්ථූපයයි. මේ කිසිවෙකුට ධාතූන්වහන්සේලා ගැනීමට නොහැකිවන පරිදි කඩුගත් අත් ඇති ලෝහමය පුරුෂයන් සහිත වාලසංඝාට යන්ත්‍රයක් සවිකොට නිබඳව කැර කැවෙන ලෙස සකස් කර තිබුණි. දඹදිව පුරා අසූහාරදහසක් වෙහෙර විහාර කරවූ ධර්මාශෝක මහරජතුමාට ඒ ඒ චෛත්‍යවල නිධන් කිරීමට සර්වඥධාතූන් ලැබුණේ මහා ස්ථූපයෙන් බව ප්‍රකටය. වාලසංඝාට යන්ත්‍රයෙහි පුරාවෘත්තය ධාතු වංශයෙන් සවිස්තරාත්මකව දැනගත හැකිය. අද දැකිය හැක්කේ ස්ථූපයේ නටබුන් පමණි.

# සප්ත පර්ණි ගුහාව

වේභාර පර්වතයේ දකුණු දිග බෑවුමේ පිහිටි අද සෝන් භණ්ඩාර් නමින් හඳුන්වන ලෙන සප්තපර්ණි ගුහාව යැයි පුරාවිද්‍යාඥ කනිංහැම් පවසයි. බුදුරදුන් පිරිනිවන් පා තෙමසක් ගතවූ තැන රහතුන් පන්සිය නමකගේ සහභාගීත්වයෙන් හා මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ අනුශාසනා ලැබ අජාසත්ත රජුගේ දායකත්වය ඇතිව මෙම ගුහාව ඉදිරිපස ඉදිකළ විශේෂ මණ්ඩපයක ප්‍රථම ධර්ම සංගායනාව පවත්වන ලදී. ධර්ම විනය දෙක සංගායනා කිරීමෙන් පසු ඒ ඒ ධර්ම කොටස් නිවැරදිව ඉදිරියට පවත්වාගෙන යාමට සුදුසු නායකත්වයක් තෝරා භාරදෙන ලදී. ගුහාව ඉදිරිපස ගල්තලාව මත හාරා ඇති වළවල් බොහෝ ගණනකි. ඒවා සංගායනාව සඳහා ගොඩනැගූ ශාලාවේ කණු බාල්ක ආදිය රැඳවීමට සකස් කළ වළවල් විය යුතුය. සප්ත පර්ණි යනු රුක් අත්තන ගස්ය. ගුහාව තුළ තිබී හිස නැති බුද්ධ ප්‍රතිමාවක් හා ශිලා ලේඛනයක් හමු වී ඇත.

ඇතැම් අය මෙය බිම්බිසාර රජුගේ භාණ්ඩාගාරය තිබුණු තැන හැටියටත් හඳුන්වති. පසුකලෙක ජෛනයන් සතු වූ මේ ලෙනෙහි බිත්තිවල ජෛන මහාවීරයන් මහාවීරගේ හා ජෛන ශාස්තෘවරුන්ගේ කැටයම් දක්නට ලැබේ.

# තපෝද නදිය

උණුදිය උල්පත් අදත් දැකිය හැකිය. එහි කරන්දක නදිය බුදුරදුන් පැන් ස්නානය කළ තැන බව කියැවේ. තප්ත යනු රත්වූ ජලය යන අරුතයි. එකිනෙකට වෙනස් වූ උණුසුමක් මේ උල්පත් ජලයෙහි ඇත. පහළට ගලන උණුදිය ජලනල මගින් ටැංකි කිහිපයකට ඒමට සලස්වා අද බ්‍රාහ්මණයන්ගේ නාන තොටුපලක් බවට පත් කරගෙන ඇත. ඒ ඒ කුල වලට ස්නානය කිරීමට වෙන වෙනම ටැංකි සදා ඇත. ඉහළ කුලවල අය නෑම, රෙදි සේදීම ආදියෙන් අපවිත්‍ර වන ජලය පහළ විශාල ටැංකියකට ගලා යයි. එය කුලහීනයන්ගේ පිහිණුම් තටාකයයි. එහි ඉතා සතුටෙන් නාන, රෙදි සෝදන කුලහීන මිනිසුන්ය. එහෙත් අප වැනිම මිනිසුන් කොටසකි. බුද්ධකාලීන භාරතයේ චතුර්වර්ණ පංචම කුල පිළිබඳ පාඩම සිහියට නැගෙන අවස්ථාවකි. ධර්ම සංවාදයෙහි දක්ෂ සමිද්ධි හිමියන් තපෝද නදියෙන් පැන් පහසුවෙන අවස්ථාවේ එතැනට පැමිණි එක්තරා දේවතාවියක් පැවිදි සැප අතහැර කම්සැප විඳීමට කථාකළ පුවතක් ද ධර්මයෙහි සඳහන්ය. රෝග සුව කරන ගුණයක් මේ උණුදිය වල ඇතැයි සිතන හින්දු, බෞද්ධ බොහෝ අය උණු දිය ස්නානය කරති.

# වේළුවනාරාමය

බිම්බිසාර රජතුමා බුදුරදුන්ට ප්‍රථමයෙන්ම පූජා කළ ආරාමයයි. උණ ගස් වලින් පිරී තිබුණ බැවිනුත් ලේනුන්ට අභය දානය ලැබුණු හෙයිනුත් වේළුවනාරාමය ලෙසත් කලන්දක නිවාසය හැටියටත් ප්‍රසිද්ධ විය. වස්කාළ පහක්ම බුදුරදුන් වේළුවනාරාමයෙහි වැඩ වාසය කොට ඇත. මේ කාලය තුළදි සම්බුද්ධ ශාසනයේ ඉතාම වැදගත් සිදුවීම් රැසක් ම සිදු විය. ආරාම පූජාවෙන් පසුව, දෙවන දවසේ බිම්බිසාර රජතුමා බුදුරදුන් සහිත භික්ෂු මහා සංඝයා කැඳවා සපිරිකර සහසතු දානයක් පිරිනමා ඥාතීන්ට පිං අනුමෝදන් කරවීමත් අනුමෝදනා වශයෙන් තිරෝකුඩ්ඩ සූත්‍රය දේශනා කිරීමත් මෙහිදී සිදුවිය. අගසව් තනතුරු සඳහා පෙරුම් පුරා ආ උපතිස්ස කෝලිත දෙදෙනා බුදුරදුන් හමුවට

පැමිණ මහණ වූයේ ද මෙහිදීය. සුනීත, සෝපාක දෙදෙනා බුදුරදුන්ගෙන් පිහිට ලැබුවේද වේළුවනාරාමයේදීය. බුදුබව ලබා ප්‍රථමයෙන් ම සිය ඥාතීන් දැකීමට කපිල වස්තුපුරවරය බලා ගමන් ඇරඹියේ ද වේළුවනාරාමයේ සිටයි. දැනට වේළුවනයේ ආරාමික නටබුන් දක්නට නැති තරම්ය. උණගස් ආදිය රෝපණය කර පොකුණු ඉදිකොට මලින් බර අලංකාර උයනක ශ්‍රීය ලබා දෙන්නට ඉන්දීය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව උත්සාහ කරන බව පෙනේ.

## නාලන්ද විශ්ව විද්‍යාලය

රජගහ නුවර සිට කි. මී. 8 ක පමණ දුර ගමන් කළ පසු නාලන්ද විශ්ව විද්‍යාලයේ නටබුන් අතරට පැමිණිය හැකිය. පෙර අප මහ බෝසතාණන් මෙහි ඉපිද නොකඩවා දන් දුන් හෙයින් නාලන්ද නම් වූයේ යැයි මතයකි. ප්‍රමාණයක් නැතිව ශිල්ප ශාස්ත්‍ර දානය කරන ස්ථානයක් වූ නිසා විශ්ව විද්‍යාලය නාලන්ද වූ බවත් පසුව ඒ අවට ප්‍රදේශය නාලන්දව නම් වූ බවත් ප්‍රකට තවත් මතයකි. ක්‍රි. පූ. 3 වන ශත වර්ෂයේදී ඇරඹුණ නාලන්ද විශ්ව විද්‍යාලයේ ස්වර්ණමය යුගය ලෙස සලකනුයේ ක්‍රි. ව. 5-7 අතර කාලයයි. 5 වන ශත වර්ෂයේ කුමාරගුප්ත රජු විසින් ද, 7 වන ශත වර්ෂයේ දි හර්ෂවර්ධන රජු විසින් ද, 9 වන ශත වර්ෂයේදී දේවපාල රජු විසින් ද මෙම විශ්ව විද්‍යාලයේ දියුණුවට සුවිශේෂ කැපවීමක් කර ඇත. දිගින් කි. මී. 10 ක් සහ පළල කි. මී. 5 ක නටබුන් අද දක්නට ඇත. ශිෂ්‍ය පිරිස දස දහසක් පමණ වූ අතර ආචාර්ය මණ්ඩලය එක්දහස් පන්සියයක් පමණ වූ බව වාර්තා ගතව ඇත. ලෝකයේ ඉපැරණි ම බෞද්ධ විශ්ව විද්‍යාලය වූ මෙහි පෙර අපර දෙදිගින්ම පැමිණි විශාල භික්ෂු පිරිසක් බුද්ධ ධර්මය විනය, අභිධර්මය, භාෂා ශාස්ත්‍ර, නක්ෂත්‍රය, ගණිතය, සාහිත්‍යය, ආයුර්වේදය ආදි විවිධ විෂයයන් අධ්‍යනය කළහ. මහාදර්ශනික නාගර්ජුන, වසුබන්ධු අසංග, සීලභද්‍ර, ශාන්තිදේව, ධර්මකීර්ති, අශ්වඝෝෂ, ධර්මපාල ආදි මහතෙරවරු නාලන්දවේ කීර්තිධර ආචාර්යවරයෝ වූහ. මෙයින් ධර්මපාල හිමියන් ලාංකික භික්ෂුවකි. උන්වහන්සේ කලක් නාලන්ද විශ්ව විද්‍යාලයේ

කුලපති පදවිය දරා ඇත. දේශන ශාලා, භෝජන ශාලා, නේවාසිකාගාර, ධාන්‍ය ගබඩා කැසිකිළි, වැසිකිළි, නාන ගෘහ, ළිං ආදියෙන් යුතුව මනා ගෘහ නිර්මාණ ශිල්පයකට අනුව තැනුණු අතර විශ්ව විද්‍යාල භූමියෙහි චෛත්‍ය හා විහාර ද බුදු පිළිමද තිබුණු බව නටබුන් වලින් අදත් පැහැදිලිය. රත්න දධි, රත්න සාගර, රත්න රංජන නමින් විශාල පුස්තකාල තුනක් තිබුණු බව පැවසේ.

මෝගල් ආක්‍රමණයෙන් ලෝක පූජිත මහාර්ඝ වස්තු සම්භාරයක් ලෝකයාට අහිමි කළහ. 12 වන ශතවර්ෂයේදි භක්තියාර් කිල්ජි විසින් විසිදහසක් පමණ වූ ගුරු ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා දන් වළඳන අවස්ථාවේදි සතර වට දොරටු අගුළු දමා වසා මුළු විශ්ව විද්‍යාලයම ගිනිබත් කළහ. පුස්තකාල තුන පමණක් පුරා මාස හයක් ගිනිගත් බව පැවසේ. කෞතුකාගාරය නැරඹීමෙන් මේ ශාප ලබන කෲර ක්‍රියාවේ ප්‍රමාණය අද වුව බුද්ධිමතෙකුට තේරුම්ගැනීම අපහසු නොවේ. පිළිස්සුණු පාත්‍ර කැබලි තුළ තිබූ දැවුණු බත් ඇට අදත් දැකිය හැකිය. පසෙක පාවාරිකාම්බවනාරාමය සහ සැරියුත් මහ රහතන් වහන්සේගේ ධාතු නිධන් කොට අශෝක මහ රජතුමා ගොඩනැගූ විශාල චෛත්‍යයෙක නටබුන් ද දැක බලා ගත හැකිය. අද එම ස්ථූපය ශාරිපුත්ත ස්ථූපය ලෙස ප්‍රසිද්ධය.

# විශාලා මහ නුවර (වෛශාලි.)

එදා වජ්ජි රාජ්‍යයේ අගනගරය විශාලා මහ නුවරයි. අද බිහාර් ප්‍රාන්තයේ මුසාපූර් දිස්ත්‍රික්කයේ වෙසාර් පැරණි විශාලා මහනුවරයි. වර්තමානයේ වෛශාලි නමින් ව්‍යවහාරවේ. බුද්ධ කාලයේ රජදරුවන් 7707 ක් සමගියෙන් රාජ්‍ය කළ ලිච්ඡවි රාජධානිය ඉතාමත් ඉසුරුබර, ආදර්ශමත් සමූහ ආණ්ඩුවක් විය. ඉතාමත් සුමුදු විනිවිද පෙනෙන හම ඇති නිසා (තුනී හමක්.) ලිච්ඡවි නම ඇතිවිය. දෙව් පුරයකට බඳු

සිරියාවක් තිබුණු බව කියවේ. ලිච්ඡවි රාජධානියේ පාලනය සඳහා වෙනමම නීති සංග්‍රහයක් තිබුණු බව මහා පරිනිර්වාණ සූත්‍රයේ දැක්වේ. ඉන් හතක් සප්ත අපරිහානිය ධර්ම වශයෙන් හඳුන්වයි.

## අභිෂේක පුෂ්කරණිය

කෞතුකාගාරය ඉදිරිපිට පැරනි ලිච්ඡවි රජවරුන්ගේ අභිෂේක පුෂ්පකරණිය අදත් පිරිසිදු ජලයෙන් පිරී තිබෙන අයුරු දැකිය හැකිය. ඔටුණු පැළඳූ පසු දක්ෂිණාවෘත සංඛයකින් පැන් ඉසීමෙන් කරනු ලබන ආශිර්වාදය සඳහා භාවිතා කළ පොකුණයි. එදා මුරකාවල් යොද ලෝ දැලින් වසා ආරක්ෂා කර තිබුණි. බුදුන් දවස බන්ධුල සෙන්පතිතුමා බලහත්කාරයෙන් පැන් ගෙනගියේ මේ පොකුණෙන් බව කියයි.

## ධාතු චෛත්‍යය

ලිච්ඡවි රජවරුන් ලත් සර්වඥධාතුන් නිධන් කළ ස්ථූපය නටබුන් අසළ වෙල්යායක් මැද අද දැකිය හැකිය. අඩි විසිපහක පමණ විෂ්කම්භය ඇති චෛත්‍යයේ අත්තිවාරම දැනට දැකිය හැකිය. වර්ෂාකාලයට මේ භූමිය වතුරෙන් යටවෙයි.

## රතන සූත්‍රය දේශනා කළ ස්ථානය

බුදුරජාණන් වහන්සේ කීපවරක්ම විශාලා මහනුවරට වැඩම කර ඇත. ඉන් වැදගත්ම අවස්ථාව වන්නේ විශාලා මහනුවර ඇති වූ තුන්බිය දුරුකිරීමට වැඩම කරවීමයි. මහලි ලිච්ඡවි රජුගේ ආරාධනය පරිදි බුදුපියාණන් වහන්සේ ආනන්ද හාමුදුරුවන් සහිත භික්ෂු මහා සංඝයා කැටුව විශාලා මහනුවරට වැඩමවා රතනසූත්‍රය දේශනා කර නගරය ආරක්ෂාකර පිරිත් පැන් ඉසින ලදී. සතියක්ම බුදුරදුන් විශාලාවේ වැඩසිටි බවත් ශ්‍රී මුඛයෙන් සත්වාරයක් ම රතන සූත්‍රය දේශනා කළ අතර මෙහිදි පන් ලක්ෂ අටානූදහසක් නිවන් අවබෝධ කළ බවත්

කියැවේ. පසු කලෙක ධර්මාශෝක මහ රජතුමා රතනසූත්‍රය දේශනා කළ ස්ථානයෙහි කරවන ලද විශාල ස්ථූපයක නටබුන් අදත් දක්නට ඇත. වටප්‍රමාණය අඩි 300 ක් පමණ වේ.

## කූටාගාර ශාලාව

රතන සූත්‍රය දේශනා කළ ස්ථානයට තරමක් ඉදිරියෙන් විශාල ගොඩනැගිල්ලක අත්තිවාරම පමණක් අද දැකිය හැකිය. ඒ එදා කූටාගාර ශාලාවයි. මේ විහාරය සාදවා පූජා කොට ඇත්තේ බුදුන් දවස විශාලාවේ ඉතාම ප්‍රසිද්ධ ව සිටි නගර ශෝභිනියක වූ අම්බපාලි විසිනි. පස්වෙනි වස කූටාගාර ශාලාවේ බුදුරදුන් ගත කළ අතර මහා ප්‍රජාපති ගෝතමී ඇතුළු ශාක්‍ය කාන්තාවන් පන්සිය දෙනෙකුට මහණ උපසම්පදාව ලැබුණි. ඒ භික්ෂුණී ශාසනයේ ආරම්භයයි.

## අශෝක කුළුණ

රතනසූත්‍රය දේශනා කළ ස්ථානයෙහි අශෝක රජු විසින් ඉදිකොට ඇති ශෛලමය කුළුණකි. එය උසින් අඩි 45 කි. මුළු ඉන්දියාවේම නොකැඩී දැනට පවතින එකම අශෝක ස්ථම්භය මෙය බව පැවසේ. අශෝක කුළුණු අතර බරෙන් වැඩිම ස්ථම්භයද මෙය වේ. මුදුනෙහි සිංහ රූපයකි. බුදුරදුන් අවසන් වරට වස්විසූ ගම්මානය ද මේයයි. මෙහි සිට පිරිනිවන් පෑමට කුසිනාරාවට වැඩම කළ පැත්ත ශෝකාකුල සිංහ මුහුණින් පෙන්වයි.

## කුසිනාරාව

ඉන්දියාවේ උත්තර ප්‍රදේශයේ දියෝරියා දිස්ත්‍රික්කයට අයත් කුසිනාරාව අද කුසිනගර් නමින් ව්‍යවහාර වේ. බුදුරදුන් දවස මල්ලව රජවරුන්ගේ රාජ්‍යයි. කරුණු තුනක් මුල්කරගෙන බුදුපියාණන් වහන්සේ පිරිනිවීමට කුසිනාරාවේ මල්ල රජවරුන්ට අයත් උපවර්තන සල් උයන තෝරාගත් සේක.

1. බුදුපියාණන් වහන්සේ කුසිනාරාවේ පිරිනිවන් පාන විට මහා සුදස්සන සූත්‍රය දේශනා කරනු ලැබේ. ඒ දේශනාව අසා බොහෝ දෙනා කුසල් කළ යුතු යැයි අවබෝධ කර ගනිති.
2. බුදුපියාණන් වහන්සේ වෙනත් තැනෙක පිරිනිවන් පානා කළ එය සුභද්ද නොදකී. බුදුන් විසින්ම හික්මවිය යුත්තෙකි. ඔහු බුදුරදුන් ජීවත්ව සිටියදිම රහත්ව අන්තිම ශ්‍රාවකයා බවට පත් වෙයි.
3. බුදුපියාණන් වහන්සේ අන් තැනෙක පිරිනිවන් පානා කළ ධාතු බෙද ගැනීමේදි මහත් කෝලාහල වන්නේය. මග ගඟ වතුර මෙන් එහිදි ලේ දැකිය හැකිය. කුසිනාරාවේදි පිරිනිවන් පානා කළ ද්‍රෝණ බමුණා එය සංසිඳුවා ධාතූන් සුදුසු අන්දමින් බෙද දුන්නේය.

මේ කරුණු තුන සලකා බුදුරජාණන් වහන්සේ පිරිනිවීම සඳහා කුසිනාරාවට ම වැඩම කළ සේක.

# පරිනිර්වාන ප්‍රතිමාව

වසර 1500 පමණ පැරණි මෙම ප්‍රතිමාව මථුරාවේ සිට හරිබල නම් භික්ෂුව විසින් කුසිනාරාවට ගෙනෙන ලදී. උන්වහන්සේ කුමාර ගුප්ත රජුගේ කාලයේ විසූහ. (ක්‍රි. ව. 413-455) ප්‍රතිමාව අති දක්ෂ ශිල්පියෙකුගේ නිර්මාණයෙකි අචේතනික සෙල් රුවක් වුවද ඉන් නිම වූ පිළිරුවේ සජීව බව නිසාම දැක දැසින් කඳුළු නොසලන කෙනෙක් නැත. දන් දන් පිරිනිවී ආකාරය පිළිමයෙන් පිළිබිඹු වේ. පසින් යටවී තිබූ ප්‍රතිමාවේ ඉතා කුඩා කැබලි එක් කොට පිළිමය නැවත සකස් කළේ කාර්ලයිල් මහතා විසිනි. පුරා යතළිස් පස්වසක් ලෝ සසුන් වැඩ වඩා සව්ලෝ සත වෙත පතල මහා කුළුණින් මුළු ජීවිතයටම කැප කළ භාග්‍යවත් බුදුපියාණන් වහන්සේ දුබල කයින් එහෙත් ප්‍රබෝධමත් සිතින් වැඩ සිටි අයුරු දෙතොල්, කම්මුල්, මුහුණ, බුදු සිරි මුව කමල වෙහෙසට පත් බවත් පෙන්වන සැටි සිරුරෙහි පැවති රෝගී ස්වභාවය පෙන්නුම් කරන සිරිපතුල් වෙහෙස ගතිය දක්වයි. ඇස්වලින් හා සිරිපතුල් දෙකෙහි ඇඟිලිවලින් ද අප්‍රාණිකභාවය පෙන්නුම් කෙරේ. සිරිපතුල් දෙස සිට මුව

කමල දෙස බලන්නම පිරිනිවණෙන් සැනසුන නිසංසල ලීලාව පෙන්වයි. ප්‍රතිමාවේ දිග අඩි 20 ක් පමණ වේ. දිග අඩි 28 ක් වූ ද පළල අඩි 8 ක් පමණ වූ ද ආසනයක සයනය කරණ ආකාරය දක්වයි. ප්‍රතිමා වහන්සේ රන් ආලේපිතය. ප්‍රතිමා ආසනය ඉදිරිපස අතිශය දුකින් වැළපෙන ආනන්ද හිමියන් ද භාවනායෝගීව සිටින අන්තිම ශ්‍රාවකයා වූ සුභද්‍ද භික්ෂුව ද පොළවේ දෙඅත් ගසා වැළපෙන මල්ලිකා දේවියගේ පිළිරුව ද නිර්මාණය කොට ඇත. පරිනිර්වාන බුද්ධ ප්‍රතිමාව තැන්පත් කොට ඇති විහාරය අමුතුම හැඩයකින් යුක්තය. මෙම විහාරය දිග අඩි 30 කි. පළල අඩි 12 කි.

## පරිනිබ්බාණ චෛත්‍යය

තථාගත සම්මා සම්බුදු පියාණන් වහන්සේ පිරිනිවන් පා වදාළ ස්ථානයෙහි මල්ල රජ දරුවන් විසින් කරවන ලද පරිනිර්වාණ ස්ථූපය යළි ප්‍රතිසංස්කරණය කරවූයේ ධර්මාශෝක මහ රජතුමා ක්‍රි. පූ. 3 වන සියවසේදීය. 1911 දී මෙම ස්ථූපයේ නටබුන් පිරික්සීමේදි ධාතු ගර්භය තුළ තිබී තඹ පත්‍රයක් හා පුරාවස්තු රැසක් හමුවිය. කුමාර ගුප්ත රජු විසින් මේ ස්ථූපය අඩි 167 ක් පමණ උසට තනා තිබුණු බව වාර්තා ගතව ඇත. බුරුම බෞද්ධයන් විසින් ගොඩනගා ඇති අඩි 165 ක් වටැති අඩි 75 ක් උස පරිනිර්වාණ ස්ථූපය අද දැකිය හැකිය.

## බුදුරදුන් අවසන්වරට පැන් වැළඳූ ස්ථානය (මාතාකුවර්.)

බේළුව ගමේ සිට පිරිනිවීම සඳහා කුසිනාරා නුවරට පා ගමනින් ම වැඩම කරවන බුදුරදුන් පිපාසිතව මෙම ස්ථානයේ වැඩ සිටි අතර ආනන්ද හිමියන් කකුත්ථා නදියෙන් පැන් ගෙනවුත් බුදුරදුන්ට පිළිගැන්වූ බව සඳහන් ය. මෙහිදි ම පුක්කුස මල්ලව රාජපුත්‍රයා බුදුපියාණන් වහන්සේට වටිනා සළු යුගලයක් පූජා කළේය. අද මේ ස්ථානය ප්‍රධාන මාවත අසල පිහිටා ඇත. මාතා කුවර් නමින් වර්තමානයෙහි

ව්‍යවහාරවේ. විහාර මන්දිරයක ස්වභාවයෙන් ගොඩනගා ඇති මේ තුළ බුදුරජාණන් වහන්සේ පිපාසිතව වැඩසිටින ලීලාවෙන් නෙලා ඇති බුද්ධ ප්‍රතිමාවක් දැකිය හැකිය.

## මකුට බන්ධන චෛත්‍යය (ආදාහන චෛත්‍යය.)

පරිනිර්වාන ස්ථූපය පිහිටි තැන සිට ප්‍රධාන මාවතේ කි. මී. 2 ක් පමණ දුර ගිය පසු බුදු සිරුර ආදාහනය කළ ස්ථානයෙහි මකුට බන්ධන ස්ථූපය හමුවේ. මල්ල රජවරුන් කිරුළු පළඳවන උත්සවය පවත්වන රාජකීය භූමියයි මේ. තම රාජ්‍යයේ ඇති සම්භාවනීය භූමිය ම මේ සඳහා තෝරා ගැනීමෙන් පෙනෙනුයේ මල්ල රජවරුන් තුළ පැවති බුද්ධ ගෞරවයයි. ආදාහනය කළ ස්ථානයේ කරවන ලද චෛත්‍යය නිසා මෙයට ආදාහන චෛත්‍යය යැයි ද කියති. ආදාහන මළුවේ ඉතිරි වූ අඟුරු චෛත්‍යයේ තැන්පත් කළ නිසා අංගාර චෛත්‍යය නමින් ද හඳුන්වනු ලැබේ. දන් චෛත්‍යයේ දක්නට ඇත්තේ ගරා වැටුණ ගඩොල් පමණි. ස්ථූපයට සමීපව තවත් පුංචි ස්ථූප අටක් දක්නට ඇත. බුදුසිරුර ආදාහනය වූ පසු ඉතිරි වූ ධාතු ද්‍රෝණ බමුණාගේ ප්‍රධානත්වයෙන් රාජ්‍ය අටකට බෙදදීම සංකේතවත් කිරීමට මේ පුංචි ස්ථූප අට කරවා ඇතැයි පැවසේ. ඒවායේ ද අද දැකිය හැක්කේ නටබුන් පමණි.

## කුකුත්ථා නදිය

මකුට බන්ධන ස්ථූපය පිහිටි උයන අසලින්ම ගලායන පුංචි දිය ඇලක් අද දැකිය හැකිය. ඒ එදා කකුත්ථා නදියයි. කාලයාගේ ඇවෑමෙන් විශාල ප්‍රදේශයක් වැලි වලින් වැසී ගොඩබිම බවට පත්ව ඇති බව පෙනේ. වර්ෂා කාලවලදි නම් විශාල ප්‍රදේශයක් ජලයෙන් යටවී පහළට ගංගාවක සිරිය ගෙන ගලායන සැටි දැකිය හැකිය. බුදුපියාණන් වහන්සේ පැන් පිපාසිතව වැඩ සිටි අවස්ථාවේ ආනන්ද හිමියන් කුකුත්ථා නදියට පැමිණ පැන් ගෙන ගොස් බුදුරදුන්ට පිළිගැන්වූ බව පැවැසේ.

# ලුම්බිණි සල් උයන

කුසිනාරාවේ සිට නේපාලය දක්වා වැටී ඇති මාර්ගය ඉතා දැකුම්කළුය. කි. මී. 140 ක් දුර පැමිණි විට ඉන්දියාව සහ නේපාල රාජ්‍යය වෙන් කෙරෙන දේශ සීමාව හමුවේ. මෙතැන සොනාලි නම් වේ. සොනාලි වලින් නේපාල රාජ්‍යයට ඇතුළු වී කි. 25 පමණ දුර ගිය විට දර්ශණීය පරිසරයක පිහිටි ලුම්බිණි උයන හමුවේ. මග දෙපස බුද්ධ ප්‍රතිමා දැකිය හැක. බෞද්ධ පරිසරයකි. සිද්ධාර්ථ නගරය යැයි දන්වීම පුවරුවකි.

ශාක්‍යයන්ගේ අගනුවර වන කපිල වස්තු පුරයටත් කෝලිය වංශිකයින්ගේ අගනුවර වන දෙව්දහ නුවරටත් අතර පිහිටි ලුම්බිනි සල් උයන දෙරට වැසියන්ටම අයිති වූවකි. මහමායා දේවියගේ මවගේ නමින් මෙම උයන නම් කර ඇතැයි සැලකේ. දෙව්දහ නුවරට වඩින අතර බුදුරාජාණන් වහන්සේ මෙම ස්ථානයේ දී දෙව්දහ සූත්‍රය දේශනා කොට ඇත.

ලුම්බිණි සල් උයනේ නටබුන් රැසකි. මෙහි සිද්ධාර්ථ ගෞතම උපත සිදුවූ තැන යකඩ වැටකින් වට කොට ඇති අතර අශෝක ස්ථම්භය එහිවේ.

අශෝක රජතුමා රාජ්‍ය ලැබ විසිවන වර්ෂයේදි උපගුප්ත රහතන් වහන්සේ සමඟ ලුම්බිණියට පැමිණි බවත් ශාක්‍ය මුනින්ද්‍රයන් වහන්සේගේ උපත සිදුවූ ස්ථානයෙහි අශ්වරූපයක් සහිත ශිලස්තම්භය පිහිටවූ බවත් සඳහන් ලේඛනයන් අශෝක ස්ථම්භය මත සටහන් කර ඇති අතර ලුම්බිණි ග්‍රාමය ද අයබදු වලින්නිදහස් කෙරෙන බව එහි ප්‍රකාශිතය. අශෝක ස්තම්භය ඉදිරිපස දර්ශණීය පොකුණකි. කුමරු බිහිවීමට පෙරාතුව මායාදේවිය ස්නානය කළ පොකුණ එය බව විශ්වාස කෙරේ. වර්තමාණයේ මෙම ස්ථානය නේපාල රාජ්‍යයට අයිතිය.

# මායා කෝවිල

ලුම්බිණි උයනට ඇතුළුවන තැනම සල් අත්තක් අල්වා ගෙන සිටි මහාමායා දේවිය කුසින් සිදුහත් කුමරු බිහිවීම පිළිබඳ සිද්ධිය කැටයම් කළ ගල් පුවරුවක් කෝවිල තුළ ඇත. මේ නිර්මාණය භූමිය කැණීමේදී හමුවුවකි. මෙහි හින්දු පූජකවරයෙකු දරුවන් නොමැති මවුවරුන්ට භාරහාරවෙමින් ශෛලමය පුවරුවේ සඳුන් ගලගාදීම නිසා මහා මායාදේවියගේ මුහුණ මැකිගොස් ඇත. අද සිදුහත් උපත දක්වෙන කිරිගරුඬ ප්‍රතිමාවක් කර ඒ අසල තබා ඇත. මේ ප්‍රතිමාව වඳ ස්ත්‍රීන්ට දරුවන් ලබාදීමේ සමත් රුවන් දේවියගේ ප්‍රතිමාව යැයි ඉන්දියානුවෝ විශ්වාස කරති.

# කපිල වස්තුපුරය

කපිලවස්තු පුරය පිහිටා ඇත්තේ හිමාල කඳු වැටියේ සිට සැතපුම් හතළිහක් පමණ ඈතින් දකුණු දිගිනි. උත්තර ප්‍රාන්තයේ බාස්ති දිස්ත්‍රික්කයේ පිප්රහවා නැමති ගම්මානය පැරනි කපිලවස්තු පුරය බව ඉන්දියානු පුරාවිද්‍යාඥයන් විසින් සොයාගනු ලැබුවේ 1975 වර්ෂයේදීය. ක්‍රි. පූ. හයවන සියවස වනවිට කපිලවස්තු පුරය ශාක්‍ය ජනපදයේ අගනගරය විය. හැකි, හපන් යන අර්ථයෙන් ශාක්‍ය නම් වී යැයි සැලකේ. සියළු යස ඉසුරෙන් පිරුණු මෙම පුරවරයෙහි පවුල් ලක්ෂයකට වැඩි ප්‍රමාණයක් විසූ බවත් කෙත්වතුවලින් සරු මිහිපිට සුරපුරයක් සේ පැවති බවත් ත්‍රිපිටක සාහිත්‍ය තුළින් හෙළිවෙයි. සුද්ධෝදන මහාරජතුමාගේ පුතණු කෙනෙකුන්ව උපන් සිදුහත් බෝසතාණෝ විසිනව වසක් මෙහි විසූහ.

# නිග්‍රෝධාරාමය

බුදුපියාණන් වහන්සේ කපිලවස්තුවට වැඩම කළ පසු සුදෙවුන් මහරජතුමන් කරවා බුදුන්ට පූජා කළ ආරාමය න්‍යග්‍රෝධාරාමයයි. කාමර 32 කින් යුතු නිග්‍රෝධාරාමයේ නටබුන් අදත් දැකිය හැකිය.

# සර්වඥධාතු ස්ථූපය

දීඝනිකායේ මහා පරිනිර්වාණය සූත්‍රයේ දක්වෙන පරිදි කුසිනාරාවේ බුද්ධ ශරීරය ආදාහනයෙන් පසුව ද්‍රෝණ බමුණා රාජ්‍ය අටකට ධාතු බෙදූ බවත් එක් කොටසක් ශාක්‍යයන්ට ලැබුණු බවත් කිවේ. ශාක්‍යයන්ට ලැබුණු කොටස නිධන් කළ ස්ථූපයේ නටබුන් අද දැකිය හැකිය. 1971 දී මෙහි කළ කැණීම් අනුව කපිලවස්තුව මෙය බව ස්ථිරවම පිළිගෙන ඇත. ස්ථූපයෙන් හමුවූ ගල්කරඬු දෙකක මෙහි ඥාතීන්ට ලැබුණු සර්වඥ ධාතු තැන්පත්ව ඇති බව සඳහන් කරයි. 1978 වර්ෂයේදී ලංකාවට කපිලවස්තු ධාතු වැඩමවාගෙන එන ලදුව ලක්ෂ සංඛ්‍යාත බෞද්ධ ජනතාවනට වැඳ පුදගන්නට ඉන් මහඟු අවස්ථාවක් ලැබුණි. දැනට එම කපිලවස්තුපුර සර්වඥ ධාතු දිල්ලි කෞතුකාගාරයෙහි රතින් නිම කළ වටිනා කරඬුවක ඉතාම ගෞරවාකාරව තැන්පත් කොට ඇති අයුරු දැකගත හැක.

# සුදෙවුන් මාළිගාව

ප්‍රධාන මාර්ගයට තරමක් ඈතින් විශාල මාළිගාවක් යැයි සිතිය හැකි නටබුන් රාශියකි. කාමර රාශියක් තිබී ඇති බව පෙනේ. සුද්ධෝදන මහරජතුමන්ගේ මාළිගාව මෙය යැයි විශ්වාස කෙරේ.

# සැවැත් නුවර (ශ්‍රාවස්ති.)

උතුරු ඉන්දියාවේ බුද්ධකාලයේ ඉතාම සමෘද්ධිමත් නගරය සැවැත්නුවරයි. අචිරවතී නදියේ දකුණු කෙළවර පිහිටා ඇත. රාජ්‍ය පාලකයා වූයේ පසේනදි කොසොල් මහරජතුමාය. සබ්බං අත්ථි මනුෂ්‍යයාගේ පැවැත්මට අවශ්‍ය සියල්ලම ඇත යන අර්ථයෙන් ශ්‍රාවස්ති වී යැයි පැවසේ. වර්තමානයෙහි මෙම ප්‍රදේශය සහෙත් - මහෙත් නමින් හැඳින්වේ.

## නව ජේතවනාරාමය (ශ්‍රී ලංකාරාමය)

අපේ ලාංකික භික්ෂූන් වහන්සේලා සැවැත්නුවර ජේතවනාරාමය ඉදිරිපස වැඩවසන ආරාමය නව ජේතවනාරාමයයි. ආරම්භයේ දී ශ්‍රී ලංකාරාමය ලෙස හැඳින්විය. අපවත් වී වදාළ අතිපූජ්‍ය මැටිවල ශ්‍රී සංඝරතන හිමිපාණන්ගේ ඉන්දියාවට සම්බන්ධ ශාසනික සේවාවේ සුවිශේෂ පියවරක් ලෙස නව ජේතවන විහාර නිර්මාණය හැඳින්විය හැක. රමණීය ප්‍රතිමා ගෘහයකි. බුදු සිරිතට සම්බන්ධ තොරතුරු චිත්‍රවලට නගා විහාරයේ බිත්ති සරසා ඇත. වන්දනාකරුවන් සඳහා අවශ්‍ය විශ්‍රාම පහසුකම් ද ඇති අතර විහාර මන්දිරය තුළදී සර්වඥධාතූන් වහන්සේලා දැක වැඳ පුද ගැනීමටත් සර්වඥ ධාතු කරඬුව හිසමත තබා ආශිර්වාද ලබා ගැනීම ද කළ හැක.

## අනේපිඬු සිටු මාළිගාව

ජේතවනාරාම පිං බිමේ සිට කි. මී. 1 ක් පමණ දුර ගිය පසු අනේපිඬු සිටුතුමාගේ මාළිගාවේ වර්තමාන නටබුන් දැකිය හැකිය. අනාථයන්ට පිණ්ඩ දුන් නිසා අනේපිඬු නම් වූ සුදත්ත සිටුතුමා පසුව 54 කෝටියක් ධනය වියදම් කොට ජේතවනාරාමය කරවා බුදුපියාණන් වහන්සේට පූජාකළේය. බුදුරදුන්ගේ අග්‍ර දායකයා වූවා සේම දිනකට තෙවරක් බුද්ධ උපස්ථානය සඳහා දෙව්රම් වෙහෙරට ගිය බව කියැවේ. දිනපතා සිටු මාළිගාවේදි 500 නමකට දානය දුන්නේය. රන් අසුරා තිබූ ගබඩා අදත් මාළිගාවේ නටබුන් අතර දැකිය හැකිය.

## අංගුලිමාල චෛත්‍යය

අනාථ පිණ්ඩික මාළිගාව සමීපයේ ඇති මෙහි නටබුන් අදත් දැකිය හැකිය. සිටු මාළිගාවේ දන් වළඳා ආපසු ජේතවනාරාමය බලා වඩින අංගුලිමාල හිමියන් මහමග අසල එක් නිවසක ගැබිණි මවක් දරු ප්‍රසූතිය පිණිස දැඩිසේ වේදනා විඳිනු අසා ඒ බව බුදුරදුන්ට පවසා ඇයට

පිහිට පිණිස අංගුලිමාල පිරිත කියා සත්‍යක්‍රියා කළේය. දරුප්‍රසූතිය වේදනාවන්ගෙන් තොරව සිදුවිය. එම ස්ථානයෙහි සාදවා ඇති ස්ථූපය අංගුලිමාල චෛත්‍යය ලෙස ප්‍රසිද්ධියට පත්විය.

## ආනන්ද බෝධිය

බුදුරජාණන් වහන්සේ ගන්ධ කුටියෙහි වැඩ නොසිටි අවස්ථාවලදි උන්වහන්සේ වෙනුවෙන් පුදපූජා පැවැත්වීමට ආනන්ද බෝධි රෝපණය සිදුවිය. ජේතවනාරාමය ඉදිරිපිට ආනන්ද හිමියන්ගේ මූලිකත්වයෙන් අනේපිඬු සිටුතුමා විසින් රෝපණය කළ ආනන්ද බෝධිය තුන්යම් රැයක් මුළුල්ලේ සමවත් සුවයෙන් වැඩහිඳ බුදුරදුන් පරිභෝගකොට පූජ්‍යත්වයට පත්කළ සේක. වසර දෙදහස් පන්සිය ගණනාවක් තිස්සේ ජේතවන බිමේ බුදුරදුන් නැති අඩුව සපුරාලමින් අද වයෝවෘධව, දුර්වලව, එහෙත් නිරුපද්‍රිතව ආනන්ද බෝධීන් වහන්සේ වැඩ සිටින අයුරු දැකිය හැකිය.

## ජේතවනාරාමය

බුදුරජාණන් වහන්සේ තුන්වන වස රජගහ නුවර සිට අනේපිඬු සිටුතුමාගේ ආරාධනයෙන් සැවැත්නුවරට වැඩිසේක. කොසොල් මහරජතුමාගේ පුතකු වූ ජේත ට අයත් උයනෙහි පුරා බිම වැසියන සේ කහවණු අතුරා ඒ මිළට ලබාගෙන අනේපිඬු සිටුතුමා බුදුරදුන්ට ජේතවන විහාරය කරවා පූජා කළේය. බිම ලබාගැනීමට කෝටි 18 ක් ද, ආරාම පංසල් කරවීමට කෝටි 18 ක් ද, විහාර පූජාව සඳහා කෝටි 18 ක් ද, මෙසේ කෝටි 54 ක වියදමෙන් විහාර පූජාව කළ බව පැවසේ. ජේතවනාරාමය යනු එක ආරාමයක් නොවේ. ආරාම රාශියකි. බුදුරජාණන් වහන්සේ පුරා අවුරුදු 19 ක් ජේතවනාරාමයෙහි වැඩ වාසය කොට ඇත. සූත්‍රපිටකයට අයත් සූත්‍ර ධර්ම සියයට අසූවක් පමණ ද, විනය පිටකයට අයත් විනය ශික්ෂා සියයට 75 ක් පමණ ද දේශණා කොට ඇත්තේ ජේතවනාරාමයේදිය. ජේතවනාරාම භූමිය තුළ සැරියුත්

මුගලන් මහ රහතන් වහන්සේලා, බුද්ධෝපස්ථායක ආනන්ද මහ තෙරුන් වහන්සේ ඇතුළු අසූ මහ ශ්‍රාවකයන් වහන්සේලාට ම සැදූ කුටි දක්නට ඇත.

## ගන්ධ කුටිය

එදා බුදු හිමියන් වැඩවිසූ ගන්ධ කුටිය අඩි 8 1/2 ක් පමණ දිග අඩි 8 ක් පමණ පළල කොටසක් ලෙස සැලකෙයි. බුදුරජාණන් වහන්සේගේ සයනාසනය තිබුණු තැන සියළුම බුදුවරයන් වහන්සේලාට සාධාරණ හා වෙනස් නොවන හෙයින් අවිජහිත ස්ථාන හතරෙන් එකක් සේ සැලකේ. ගන්ධ කුටියේ සයනාසනය පිහිටි කොටස හැර අඩි 50 පමණ සම සතරැස් කොටස බුදුපියාණන් වහන්සේ මහරහතන් වහන්සේලා ඇතුළු භික්ෂු ගිහි පිරිස් සමග ධර්ම සාකච්ඡා කළ ස්ථානයයි. ඉදිරි වට ශාලාව සිව්වනක් පිරිස බුදුන් දකින්නට පැමිණ සිටි ශාලාවයි. ගන්ධ කුටියෙහි දැනට ශේෂව ඇත්තේ පදනම පමණි. දිගින් අඩි 115 ක් හා පළලින් අඩි 90 ක් පමණ වූ මේ ගොඩනැගිල්ලෙහි පදනම අඩි 8 ක් පමණ වේ. ගන්ධ කුටියෙහි වහළ අනේපිඬු සිටුතුමා හඳුන්ලියෙන් කළ බව පැවසේ. ගන්ධකුටිය ඉදිරිපස බුදුරදුන් වසර 19 ක් ම පැන් පරිභෝග කළ ළිඳ අදත් ජලයෙන් පිරී ආරක්ෂාකාරීව පවතින අයුරු දැකිය හැකිය.

## දම්සභා මණ්ඩපය

ගන්ධ කුටියට ඉදිරිපසින් දම්සභා මණ්ඩපය අදත් දැකිය හැකිය. දහසක් දෙනාට රැස්විය හැකි තරම් විශාලය. එහි මැද අඩි 5 ක් පමණ උස්වූ අඩි 8 ක් පමණ දිග අඩි 6 ක් පමණ පළල වේදිකාවකි. මෙය බුදු පියාණන් වහන්සේ ධර්මදේශනා කිරීමට වැඩසිටි ආසනය සේ සැලකේ. එදා මේ දම්සභා මණ්ඩපය තුළ මොනතරම් ආශ්චර්යමත් දේ සිදුවීද.

# පුබ්බාරාමය

අනේපිඬු මාළිගාවෙන් දකුණු පස විශාඛා මහ උපාසිකාව විසින් කරවන ලද පූර්වාරාමය දැකිය හැකිය. දම්සභා මණ්ඩපයේදි අමතක වූ මේස පළඳනාව නොගත යුතු යැයි සිතූ එතුමිය එම පළඳනාව කහවනු 26 කෝටියකට විකුණා පූර්වාරාමය කරවා බුදුපාමොක් මහසඟනට පූජා කරණ ලදි. බුදුරජාණන් වහන්සේ මෙහි වසර හයක් වැඩවාසය කොට ඇත. අද සියල්ල නටබුන්ව ගොස් ඇති අයුරු දැක බලාගත හැකිය.

# ගන්ධබ්බ චෛත්‍යය

ජේතවනාරාමයට කි. මී. 1 ක් පමණ දුරින් ප්‍රධාන මාර්ගය අයිනේ මේ ස්ථානය හමුවේ. බුදුරජාණන්වහන්සේ තීර්ථකයන් දමනය කරණු පිණිස අවසන් වරට යමා මහ පෙළහර පෑ ස්ථානයෙහි කරවන ලද චෛත්‍යයි. අද මෙය වල් බිහිවුණු සේ දැකිය හැකිය. ගණ්ඩබ්බ නම් උයන් පල්ලා පිදූ අවාරෙට පළගත් අඹගෙඩිය වළඳා සිටවූ තැන පැන නැගී අඹගස අසළ දී බුදුරදුන් යමාමහ ප්‍රාතිහාර්ය දක්වා හත්වන වර්ෂා සෘතුව තව්තිසා දෙව්ලොව ගතකොට මාතෘ දිව්‍යරාජයා ඇතුළු දෙව්පිරිසට අභිධර්මය දේශනා කිරීමේ අදහසින් මෙතනින් අහසට පැන නැගී වැඩම කළ බව පැවසේ. ධර්මාශෝක මහ රජතුමා මෙම ස්ථූපය කරවා ඇත.

# සංකස්ස පුර ස්ථූපය

බෞද්ධ ආගමික ඉතිහාසයේ සුවිශේෂ ස්ථානයක් සංකස්ස පුරයට හිමිවේ. ඉන්දියාවේ උත්තර ප්‍රාන්තයේ ෆාරුකාබාද් ප්‍රදේශයට අයත් සංකස්ස නගරය අද සංකිස්සා යනුවෙන් හැඳින්වේ. ශ්‍රාවස්ති නගරයේ සිට කි. මී. 400 පමණ දුර ඇත. සියළු බුදුවරයන් වහන්සේලා අත්නොහරින අවිජහිත ස්ථානවලින් එකකි.

ගණ්ඩබ්බ රුක් සෙවනේදී අනන්ත අපරිමාන පෙළහර දක්වා තීර්ථකයන් දමනය කොට තව්තිසා භවනයට වැඩි බුදුරදුන් පුරා වස් තුන් මාසයම දෙවියන්ට අභිධර්මය දේශනා කළ සේක. වස් පවාරණයෙන් පසු එනම් වප් මැදින් පෝද ශක්‍ර බ්‍රහ්මාදීන්ගේ පූජා උපහාර මැද සංකස්ස නුවරට වැඩිසේක. දෙවියන් විසින් මවා දුන් සත්රුවන් හිණිමගින් බුදුරදුන් වැඩ සංකස්සපුර මිහිමතට සිරිපා තබනවාත් සමගම සත්රුවන් හිණිමග පොළවේ ගිලී ගිය බව පැවසේ. මේ ස්ථානයෙහි රුවන් හිණිමගක් කරවා නිධන්කොට ධර්මාශෝක මහරජතුමා විශාල ස්ථූපයක් කරවන ලදි. අද එය විශාල වශයෙන් ගරාවැටෙමින් පවතී.

එදා බුදුරදුන් සමග දෙව්ලොව සිට පැමිණි දෙවියන් හා බ්‍රහ්මයන් මිනිසුන් දුටු බවත් මිනිසුන් දෙවියන් හා බ්‍රහ්මයන් දුටු බවත් පැවසෙන මහා පෙළහර දේවාවරෝහණයයි. මෙය ලෝකවිවරණ ප්‍රාතිහාර්ය ලෙසද හඳුන්වනු ලැබේ. මතුබුදුවන මෛත්‍රී බෝසතුන් ද එදින නියත විවරණ ලැබ මේ ස්ථානයේදිම උතුම් පැවිදි බවට පත්විය.

## ආග්‍රා

මෝගල් පාලන සමයෙහි අගනුවර පැවතියේ වර්තමාන ආග්‍රා නගරයේය. රතු බලකොටුව සහ ටජ්මහල් පිහිටා ඇත්තේ මෙහිය. දඹදිව වන්දනා ගමනේදී මේවා නැරඹිය යුතු ස්ථාන ලෙස සැලකේ. වර්තමානයේ ද මෙහි ජනගහනයෙන් වැඩි පිරිසක් මුස්ලිම් වරුන් වෙති.

## රතු බලකොටුව

පැරණි මෝගල් රජ පවුල් කිහිපයක මාළිගා සංකීර්ණයයි. දිය අගල් පවුරු වලින් වටව ආරක්ෂා සහිතව තනා ඇති රතු බල කොටුව රජසැප නම් මේ යැයි විදහා දක්වන්නකි. මාළිගා, පොකුණු, තටාක, රංග මන්දිර, අන්තඃපුර, බිසෝකාමර, ගබඩා පල්ලි, කිරිගරුඬින් කරන ලද කැටයම්, රාජසභා ආදිය මෙහිදි දැකිය හැකිය. 16 වන සියවසේ විසූ

අක්බාර් අධිරාජයා සිය රජදහන ලෙස යමුනා ගං තීරයේ සුන්දර මිටියාවත්ත පිහිටි උස් බිමක මෙම රතු බලකොටුව රතු ගලින් තනා ඇත.

# ටජ් මහල්

රතු බලකොටුවෙන් කි. මී. එකක පමණ දුරින් යමුනා ගංතෙර ඉස්මත්තේ ටජ්මහල් ගොඩනගා ඇත. ලෝකයේ පුදුම වලින් එකක් බව කියවේ. අක්බාර් රජුගේ පුත් ෂාජහාන් රජුගේ ප්‍රියතම දේවිය වූ මුම්ටාස් සිය දහතර වැනි දරුවා ප්‍රසූත කිරීමේදි මිය ගියාය. මේ අකල් මරණයෙන් කම්පාවූන ෂාජහාන් බෙහෙත් ගැල්වූ මිනිය තැන්පත් කර මේ අලංකාර සොහොන්ගෙය නිර්මාණය කර ඇත. කිරිගරුඬින් ම ගොඩනැගුණ ටජ්මහල මහල් තුනකින් යුක්තය. දිග අඩි 157 ක්, පළල අඩි 117 ක් සහ උස අඩි 100 ක් වූ ප්‍රධාන දොරටු තුනකි. කම්කරුවන් ලෙස වහලුන් විසිදහසක් යොදවා පුරා විසි අවුරුද්දක් මුළුල්ලේ මේ මන්දිරය ඉදි කළබව කියැවේ. 1631 දි පර්සියාවේ උස්තාන් අහමඩ් ගේ සැලැස්මට කැමති වූ රජු ඔහුට ටජ් මහල් ගොඩනගන්නට භාරදී තිබේ. වැනිසියේ වෙරෝනියෝ මෙහි නිර්මාණ ශිල්පියා ලෙස සමහරු අදහස් කරති. මේ නිර්මාණය කළ ශ්‍රේෂ්ඨ ශිල්පියාට ෂාජහාන් රජු උපහාර දක්වා ඇත්තේ ඔහුගේ ඇස් අන්ධ කිරීමෙන්ය. කෙසේ වෙතත් ආදරය වෙනුවෙන් ලොව අපූර්ව නිර්මාණයක් කිරීමට ෂාජහාන් රජු සමත්වීම නිසා ඔහු අමරණීයත්වයට පත්ව ඇත.

# නවදිල්ලිය

ඉසුරුබර සුන්දර නගරය නවදිල්ලියයි. එදා බුද්ධ කාලයේත් එසේ විය හැකියැයි සිතෙන්නේ කුරු රට නමින් හැඳින්වූයේ වත්මන් දිල්ලි ප්‍රදේශය නිසාවෙනි. අද දිල්ලි හරියානා ප්‍රාන්තයට අයත් වත්මන් ඉන්දියාවේ අගනුවරයි. ඉමක් කොනක් නොපෙනෙන මහ නගරයකි. ගොඩනැගිලි,

මංමාවත්, කිසියම් රටාවකට නිමවී ඇති සෙයක් පෙනේ. මග දෙපස ක්‍රමවත් ලෙස වවන ලද තුරුලිය නගරය වඩාත් අලංකාර කරයි. ජනාකීර්ණ නගරයකි. ඉතාම ප්‍රවේශමෙන් සංචාරය කළ යුතුය.

නවදිල්ලියේ අභිමානවත්ව කැපී පෙනෙන ගොඩනැගිල්ල (රාෂ්ට්‍රපති භවාන්) ජනාධිපති මන්දිරයයි. තරමක් රතට හුරු අඳුරු පැහැති දැවැන්ත මන්දිරයකි. මුදුනෙහි ඉන්දීය ජාතික ධජය ලෙළදෙයි. නවදිල්ලිය පුරා සංචාරය කරණ ඔබට පහත ස්ථානයන් දැක බලා ගැනීමට ලැබෙනවා ඇත.

ලෝක්සභා (ඉන්දීය පාර්ලිමේන්තුව.) ඉන්දියා ගේට්, මහත්මා ගාන්ධි, ශ්‍රී ජවහර්ලාල් නේරු (ඉන්දියාවේ ප්‍රථම අග්‍රාමාත්‍යවරයා.) ශ්‍රීමති ඉන්දිරා ගාන්ධි, සංජේ ගාන්ධි, රජීව් ගාන්ධි වැනි ඉන්දියාවේ ශ්‍රේෂ්ඨ නායක, නායිකාවන්ගේ ජීවන තොරතුරු එක් රැස් කොට ඇති කෞතුකාගාර ලෝටස් ටෙම්පල් (බහායි ධර්ම මූලස්ථානය.) හා තවත් මග දෙපස කොතෙකුත් විසිතුරු දේ දැකිය හැකිය. ලක්ෂ්මී නාරායන් කෝවිල (බිර්ලා මන්දිරය.) තවත් සුවිශේෂ ස්ථානයකි. මීට යාබදව අපේ සිංහල භික්ෂූන් වහන්සේලා වැඩ සිටින ඉන්දියා මහාබෝධි නවදිල්ලි විහාරය පිහිටා ඇත.

# සාගර් නගර් (සතිපට්ඨාන සූත්‍රය දේශනා කළ ස්ථානය.)

දිල්ලි නගරයේ සිට කි. මී. 10 ක් පමණ දුර ගමන් කළ පසු මේ ස්ථානය දැකිය හැකිය. බුදුරජාණන්වහන්සේ එදා සතිපට්ඨාන සූත්‍රය වැනි ගැඹුරු ධර්මයන් දේශනා කිරීමට තෝරා ගත්තේ කුරුරට කම්මාස්සදම්ම නම් නියම ගමයි. හේතුව එම ගැඹුරු ධර්මය තේරුම් ගැනීමට තරම් බුද්ධිමත් ජනතාවක් එහි සිටි නිසා විය යුතුය. අශෝක රජතුමා මෙහි ඇති පර්වතයක සටහන් කර ඇති ලේඛනයක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ආරක්ෂා කෙරෙමින් ඇත.

# කොසඹෑ නුවර

බුදුරදුන් වැඩ සිටි සමයේ වත්සය රාජ්‍යයේ අගනගර වූයේ කොසඹෑ නුවරයි. උදේනි කොසඹෑ නුවර එදා ප්‍රසිද්ධ රජුය. ඝෝෂිතාරාමය - කුක්කුටාරාමය - බදරිකාරාමය - පාවාරිකාරාමය - පාරිලෙය්‍ය වනය - සිංසපාවනය එදා බුදුරදුන් වැඩ සිටි ස්ථානයන්ය. මාගන්දිය - සාමාවතිය වාසුලදත්තා පිළිබඳ තොරතුරු අපට හමුවන්නේ කොසඹෑ නුවරදීය. බුදුරජාණන් වහන්සේගේ ලලාටධාතුව අවසන් වරට වඩා හිඳුවා ඇත්තේ කොසඹෑ නුවර ඝෝෂිතාරාමයේය. එම ගන්ධ කුටිය අදද දැකිය හැකිය. එම ලලාට ධාතුව ඝෝෂිතාරාමයෙන් ලංකාවට වැඩම කරවා ඇත්තේ මහාදේව මහරහතන් වහන්සේ විසිනි. පසු කලදී මෙම ලලාට ධාතුව තැන්පත් කොට සේරුවාවිල මහා දාගැබ කරවා ඇති බව පැවසේ.

# දඹදිව වන්දනා ගමන් මාර්ගය



| අංකය | ස්ථානය |
|---|---|
| 1 | කටුනායක (ශ්‍රී ලංකාව) |
| 2 | දිල්ලි |
| 3 | සාංචි (බෝපාල්) / කොසඹෑනුවර |
| 4 | බරණැස් නුවර (වාරාණසි) |
| 5 | සාරානාථය (වාරාණසි) |
| 6 | බුද්ධගයාව |
| 7 | රජගහනුවර |
| 8 | නාලන්දාව |
| 9 | පාටලීපුත්‍ර නගරය (පැට්නා) |
| 10 | විශාලා මහ නුවර |
| 11 | කුසිනාරා නුවර |
| 12 | ලුම්බිණිය (නේපාල රට) |
| 13 | කපිලවස්තුපුර (තිලෞරකොට් පුරය) |
| 14 | සැවැත්නුවර (ජේතවනාරාමය) |
| 15 | සංකස්සපුරය |
| 16 | ආග්‍රා නගරය |
| 17 | නවදිල්ලිය (කුරුරට) |

# චාරිකා සංවිධායකගෙන්,



වසර ගණනාවක සිට දඹදිව වන්දනා චාරිකා තුළින් ලත් අත්දැකීම් මත ලක්දිව චාරිකා නමින් දඹදිව වන්දනා චාරිකා සේවයක් ඇරඹිමි. ලක්දිව චාරිකා සමඟින් දඹදිව වන්දනාවේ යන බැතිමතුන්ගේ ප්‍රයෝජනය සඳහා මෙම පොත් පිංච සකස් කරවන ලදී.

මෙම පොත සැකසීමේදී දඹදිව වන්දනා පිළිබඳ මනා අත්දැකීම් ඇති මහල්වරාවේ පදිංචි කේ. පී. ඩී. සමරසේකර මහතාට හා වැල්ලවත්තේ බෝධිරුක්ඛාරාමාධිපති පූජ්‍ය වස්කඩුවේ ධම්මිස්සර හිමියන් ගෙන් ලද උපදෙස් හා අනුශාසනා අගේ කොට සලකන අතර මාගේ විශේෂ හෘදයාංගම ස්තුතිය නීතිඥ ආනන්ද එන්. තිලකරත්න මහතාට හිමිවේ.

ස්තුතිය.

**පාලිත මාතරගේ**
චාරිකා සංවිධායක.
2003. සැප් : 13